# හැකියාවෙන් උපයමු-Feverr

Fiverr කියන්නේ දැන් ලංකාවේ ගොඩක් ප්‍රසිද්ධ සයිට් එකක්. ඔයාගේ හැකියාවෙන් අන්තර්ජාලයෙන් මුදල් හොයන්න ලේසිම තැන තමයි මේක.

## What is Fiverr?

Fiverr කියන්නේ Online Mini MarketPlace එකක්. ඒ කියන්නේ අන්තර්ජාලයේ තියෙන පොළක්, Shopping Complex එකක් වගේ තැනක්. ඔයා Shopping Complex එකකට ගියාම ඒකේ එක එක ජාතියේ භාණ්ඩ හා සේවාවන් තියෙනවා. Shopping Complex එකේ තියෙන හැම භාණ්ඩයක්ම, හැම සේවයක්ම ඔයාට ලැබෙන්නේ යම්කිසි මුදලකට. මුදල් දුන්නේ නැති වුනොත් ඔයාට ඒ දේවල් ලැබෙන්නේ නෑ. ඒ වගේම තමයි Fiverr කියන තැනත්.

Fiverr එකේත් භාණ්ඩ හා සේවාවන් තමයි විකිණෙන්නේ, හැබැයි මාධ්‍ය වෙනස්. ඇත්තම කිව්වොත් Fiverr එකේ විකිණෙන්නේ නැති දෙයක් නැති තරම්. දැන් ඔයා

හිතනවා ඇති, මේ Fiverr කියන්නේ Online MarketPlace එකක් නිසා, ඕකේ විකුණන්න පුලුවන් Online හෝ Digital දේවල් විතරයි කියලා, එහෙම එකක් නැහැ. මෙතන කලින් කිව්වා වගේ ඕන දෙයක් විකුණන්න පුලුවන්. Fiverr වල විශේෂත්වය තමයි ඕන දෙයක් $5යි. ඉතින් Fiverr කියන්නේ $5ට වැඩකරන පුද්ගලයා.

උදාහරණයක් විදිහට මෙහෙම හිතන්නකෝ. දැන් ඔයා යනවා Shopping Complex එකකට. ඒක ඇතුලේ ඉන්න Sellersලා එයාලා විකුණන භාණ්ඩ හා සේවාවන් තියාගෙන ඉන්නවා. එක ඇතුලට ගියපු ඔයා ඒක ඇතුලේ කැරකෙද්දි එක එක ජාතියේ, ලස්සන දේවල් දකිනවා. ඉතින් ඔයා ඒ එක දෙයක් මිලදීගන්නවා. එතනදී ඔයා ගත්තේ Entertainment දෙයක්.

තව ටිකක් ඉස්සරහට යනකොට ඔයාට පේන්වා ඔයා කියවන්න ආසම කරන Sci-Fi Stories, Science ගැන පොත් ටිකක්. ඉතින් ඔයා ඒකෙනුත් එක පොතක් මිල්දීගන්නවා. එතකොට මෙතනදී ඔයා ගත්තේ Valuable Book එකක්.

මං හිතන්නේ දැන් ඔයාට Idea එක තේරෙනවා ඇති. ඔය විදිහට ඔයා Shopping Complex එක වටේ යද්දී ඔයට අවශ්‍ය දේවල් එක එක පේන්න ගන්නවා. ඉතින් ඔයා ඒ දේවල් ගන්නව. මෙතනදි ඔයා ආස දේවල් වගේම ඉගෙනගන්න අවශ්‍ය දේවලුත් ගත්තා. මේ දේම තමයි Fiverr එක ඇතුලෙත් වෙන්නේ. මේ පුංචි උදාහරණය මෙහෙම කියන්න පුලුවන්.

**"මිනිස්සුන්ගේ අවශ්‍යතා හා වුවමනා ලස්සනට, අවංකව Fulfill කරනකොට ඒකට ඉල්ලුමක් ඇතිවෙනවා"**

ඔයා මොනාහරි දෙයක් කරන්න යනකොට වෙන්නේ මොකක්ද? කොහොමද කරන්නේ? කියලා දැනගෙන පටන්ගන්න. එත්කොට ඔයාට වරදින තැන් ගොඩක් අඩු වෙනවා. කෙටියෙන්ම කිව්වොත් Fiverr එක ඇතුලේ යන්නේ මිනිසාගේ වුවමනාවන් තෘප්තිමත් කිරීමයි. ඒ නිසා ඔයාට තෘප්තිමත් කරන්න හොඳ Want එකක් හෝ අඩුම තරමේ Need එකක්වත් මතක් කරගන්න.

# Why Fiverr..?

ඔයා සමහරවිට දැන් ලෝක ප්‍රසිද්ධ Freelancer, oDesk වගේ සයිට් ගැන දන්නවා ඇති, සමහරවිට ඒවා කරන්න උත්සහා කරනවත් ඇති. මං පටන්ගනිද්දිම කිව්වා අන්තර්ජාලයෙන් මුදල් හොයන්න පටන්ගන්න හොඳම තැන Fiverr කියලා. Fiverr කියන සයිට් එක අනිත් Freelancer, oDesk, Elance වගේ සයිට් වලට වඩා හොඳ වෙන්නේ, පටන්ගන්න ලේසී වෙන්නේ මේ දේවල් නිසා.

➠ $5 එහෙමත් නැත්නම් රු.700 අවදානමේ දාන්න බැරි ගාණක්ද? මං එහෙම හිතන්නේ නැහැ. ඒ වගේම ලෝකේ ගොඩක් දෙනා හිතන්නෙත් එහෙම. ඉතින් මේ $5 කියන පුංචි ගාන නැතිවුනා කියලා ඒ තරම් පාඩුවක් වෙන්නේ නැනේ. ඒ නිසා Fiverr Sales වලින් පිරුන තැනක් වෙනවා අයාසයකින් තොරවම.

අපිට පුලුවන් මේ කියන දේ අපේ, ඒ කියන්නේ Fiverr Seller කෙනෙක් විදිහට වාසියට හරවා ගන්න. මේ නිසා තමයි මුලින්ම අන්තර්ජාලයෙන් මුදල් හොයන්න පටන්ගන්න කෙනෙකුට වුනත් මේකෙන් ඒතරම් අමාරුවක් නැතුවම සාර්ථක වෙන්න පුලුවන් කියලා කිව්වේ.

➠ චුට්ටක් හිතන්නකෝ, වෘත්තිය මට්ටමේ Freelance Sites වලින් Project එකක් කරගන්න ගියාම යන වියදම. මේ කියන්නේ ඒ යන වියදම වැඩියි කියලා නම් නෙමේ. ඒක තමයි සමාන්‍ය Market Prize එක. ඉතින් ඒ වගේ ගාණක් වියදම් වෙන එක කිසිම අවුලක් නැහැ.

වෘත්තිය මට්ටමේ Freelance සයිට් එක්ක සසඳලා බලද්දී Fiverr කියන්නේ Cheap Online MarketPlace එකක්. මේක තමයි ප්‍රධානම හේතුව Fiverr සාර්ථක වෙන්න බලපාන.

➠ Fiverr වලට වැඩිපුරම එන්නේ Online Marketersලා. මේ අය එයාලගේ ලොකු Project Outsource කරගන්න තමයි Fiverr වලට නිතරම වගේ එන්නේ.

Outsource කියලා කිව්වේ ලොකු Project එකක් පොඩි පොඩි කැලි වලට කඩලා ලාභෙට කරගන්න එකට කියලා කියන්න පුලුවන්.වෘත්තිය මට්ටමේ Freelance සයිට් එකකින්

එකපාර එක Project එකකට ගන්න ගාණ වගේ ගාණක් ලැබෙන්නේ නැති වුනාට $5කට වඩා ගන්න පුලුවන් වෙන්නේ මේ නිසා.

➠ $5 කියන්නේ ගොඩක් පුංචි  ගාණක් විදිහට ඔයාට පේන්න පුලුවන්. ඒත් ඔයා හිතන තරම් $5 පුන්චිත් නැහැ, Fiverr වාටරුත් නැහැ. ඔයා තාමත් Fiverr කරන්න පටන්ගත්තේ නැත්තේ එක වැඩකට $5 ලැබෙන නිසාද?

එහෙනම් මෙහෙම හිතන්නකෝ.ඔයාට එක වැඩකට ලැබෙන්නේ $5. ඔයාට දවසට වැඩ 10ක් එනවා. ඉතින් මාසෙට වැඩ 300 එනවා, ඒ කියන්නේ 300 * 5 = $1500. දැන මොකද ඔයා කියන්නේ? මේ ගාණත් මදිද? මේ වගේ අදායමක් සාමාන්‍ය මනුස්සයෙක්ට ලැබෙන්නේ නැහැ. ඒත් ඔයා සාමාන්‍ය කෙනෙක් වෙලත් Fiverr වලින් මේ වගේ ආදායමක් ගන්න පුලුවන් වෙලා තියෙනවා.

දැන්වත් ඔයාට පේන්වද Fiverr වල තියෙන Potential එක එහෙමත් නැත්නම් Fiverr වලින් හොයාගන්න පුලුවන් ආදායම.

➠ වෘත්තිය මට්ටමේ Freelance සයිට් එකකින් සාර්ථක වෙන්න ටිකක් අමාරුයි. ඒකට Reputation, Portfolio & Profile Completion වගේ දේවල් බලපානවා. අනික Project එක දෙන කෙනාට Risk එකේ දාන බැරි ගාණක් වියදම් කරන්න වෙන නිසා, එයා හොඳම කෙනාව තමයි තෝරගන්න බලන්නේ.

නමුත් Fiverr වල එහෙම දේවල් අවශ්‍ය නැහැ. පළවෙනි Sale එක 24hr ඇතුලත වුනත් ගන්න පුලුවන්.

ඔයා අන්තර්ජාලයෙන් මුදල් හොයන්න තාමත් අලුත් කෙනෙක්නම් ඔයාට ලොකු විශ්වාසයක් නැතුව ඇති මේ දේවල් ගැන. මේක මුලදීම මං ඔයාට දෙයක් ගැන Guarantee වෙනවා. ඔයා මේ පාඩම හරියට කියවලා ඒ විදිහට System එක පිළිපැද්දොත් ඔයාට අනිවාර්යෙන් පළවෙනි සතිය ඇතුලත Sales 3වත් එනවා.

Fiverr කියන්නේ Online Mini MarketPlace එකක් කියලා මං කලින් කිව්වා. ඉතින් Fiverr පටන් ගන්න කැමති නම් ඔයා මුලින්ම කරන්න ඕන දේවල් ටිකක් තියෙනවා. හැම දෙයක්ම පටන්ගන්න කලින් හොන්දට Plan කරාම ඒකේ Foundation එක ගොඩක් ශක්තිමත්. කිසිම Plan එකක් නැති දෙයක් ලේසියෙන් සාර්ථක වෙන්නේ නැහැ. ඒක නිසා මුලින්ම Plan එක, ඊටපස්සේ ඒක Follow කිර්රිම කරන්න.

සාමාන්යයෙන් ඔයාට Fiverr පටන්ගන්න ඕන වුනාම ඔයා මුලින්ම කරන්නේ ඉක්මනින් ගිහින් Fiverr Account එකක් හදන එකනේ, ඒත් හොන්දට Plan කරලා කරද්දී ඒක නෙමෙයි ඔයා ගන්න ඕන පළවෙනි Step එක. Fiverr Account එකක් හැදුවට වැඩක් නැහැ කරන්නේ මොනාද කියලා කිසිම Idea එකක් නැත්නම්..!

අපි Fiverr එක ගැන තව දුරටත්  අදහසක් ගමු.

## Fiverr Language, Get Used To It

හැබැයි ඒක කියන්න කලින් Fiverr පාවිච්චි කරනකොට අහන්න ලැබෙන දේවල් ගැන ටිකක් කියන්නම්. එතකොට අවුලක් නැතුව වැඩේ කරන්න පුලුවන්. Fiverr එකට සම්බන්ධ පාර්ශවයන් 2යි. මේ කට්ටිය හින්දා තමයි Fiverr එක ඇතුලේ Business එකක් වෙන්නේ.


1. Buyers – මේ කියන්නේ ඔයාගේ සේවය හෝ භාණ්ඩය අරගෙන සල්ලි දෙන පුද්ගලයා. අනිත්Freelancer Sites වගේ නෙමෙයි Fiverr එකේ Buyersලට Payment එක කරන්න ලේසියි වගේම වැඩේ කරාට පස්සේ සල්ලි නොදී ඉන්න බැහැ, මොකද මුලින්ම Payment එක කරලා ඉන්න ඕනා වැඩේ බලන්න.

2. Sellers – මේ කියන්නේ සේවය හෝ භාණ්ඩය විකුණන පුද්ගලයා, වෙනත් විදිහකින් කිව්වොත් මේ තමයි ඔයා අයත් වෙන පාර්ශවය. ඔයා විකුණන හැම දෙයක්ම $5 නමුත් ඔයාට ලැබෙන්නේ $4 ඉතුරු $1 Fiverr Service Fee එකක් විදිහට එයාලට කැපෙනවා.

දැන් කියන්නම් Fiverr Language එක ගැන, මේවා දැනගෙන Fiverr පාවිච්චි කරනකොට අවුල් සහගත් තැන් එනවා අඩු වෙයි..!!

➠Gig – ඔයා Fiverr එකේ දෙන භාණ්ඩය හෝ සේවයට තමයි Gig එකක් කියලා කියන්නේ.

➠Featured Gig – Fiverr එක හොඳට  අලෙවිවෙන Gig වලට කැමතියි. ඉතින් ඒ අය Gig එක Featured කරනවා. එහෙම නැත්නම් අපිට ඉල්ලන්නත් පුලුවන්. මෙහෙම කරාම Gig එක නිතරම වගේ Homepage එකේ පළවෙනි Gig Listing 4න් එකකට එනවා. ඒ වගේම Featured Gig Badge එකකුත් ලැබෙනවා Gig එකට. වෙනත් විදිහකින් කිව්වොත් Fiverr Community Trust එක ලැබෙනවා.




➠Request Gigs – මේ කියන්නේ Fiverr එකේ තියෙන තවත් Feature එකක්. මේක නිසා සමහර අයට Punishment හිටන් ලැබිලා ඇති. මේක තියෙන්නේ දකුණු පැත්තේ Fiverr Sidebar එකේ. මේකෙන් ප්‍රදානවම වෙන්නේ Buyersලට අවශ්‍ය දේවල් කරගන්න ගැලපෙන Sellers ලව හොයාගන්න එක. මේකේ දාන ඕන දෙයක් දාන්න පුලුවන් Buyer කෙනෙක්ට විතරයි. ඔයාගේ Fiverr Gigs ගැන කියලා ඕකේ දැම්මොත් ඔයාට Fiverr එකෙන් ප්‍රශ්ණ වෙයි.(Restrictions, Limitations.!!)

➠Fiverr Levels – Fiverr එකේ වැඩ කරන එක ටිකක් Fun වෙන්නත් එක්ක තමයි Fiverr Levels තියෙන්නේ. Fiverr එකේ ප්‍රදානව Levels 4ක් තියෙනවා. Level 1, Level 2, Top Rated Seller & Fiverr Super Seller තමයි Levels ටික.

➠Gig Extras – කලින් කිව්ව Fiverr Levels ලැබෙනකොට ලැබෙන එක Feature එකක් තමයි Gig Extras කියන්නේ. මේක ලැබුනම ඔයාට පුලුවන් $5ට වඩා ලොකු ගාණකට වැඩකරන්න. $10, $20, $40 වගේම $100 වෙනකනුත් යන්න පුලුවන් උපරිම Levels වලට ගියාම.

➠Fiverr Revenue Card – මේ කියන්නේ Payoneer MasterCard Debit Card එක ගැනම තමයි.

## This Gig, That Service, What Product…!!

Fiverr Language එකත් මතක තියාගෙන පළවෙනි Step එක කරන්න. ඔයා Fiverr එකෙන් මුදල් හොයනවද නැද්ද කියන එක තීරණය වෙන්නේ මේ Step එකෙන්. මෙතනදි ඔයා වැරදි දෙයක් තෝරගත්තොත් ඔයා Fiverr වල සාර්ථක වෙන්නේ නෑ. නමුත් මෙතනදි විතරක් හරියටම නිවැරදි දෙයක් කරලා නිකං බලාගෙන හිටියා කියලත් ඔයා සාර්ථක වෙන්නේ නෑ. ඒක තමයි Challenge එක.

හොඳ Strong Plan එකක්, Vision එකක් එක්ක, මහන්සි වෙලා වැඩකරන්න පුලුවන් නම් ඔයාට මේක ගින්නක් නෑ.

අද වෙනකොට Fiverr එකේ නැති දෙයක් නැති තරම්, පහළින් තියෙන්නේ දැනට Fiverr එකේ Gig Category Range එක. කෙටියෙන් කිව්වොත් ඔයාට Gig Idea එකක් එහෙමත් නැත්නම් කරන්න පුලුවන් දෙයක් තෝරගන්න ප්‍රදාන වර්ග(Main Categories) 12ක් තියෙනවා. ඒ වගේම මේ ප්‍රදාන වර්ග 12 තවත් උපවර්ග(Sub-Categories) 119ක් බෙදලා තියෙනවා.

**Gifts**

Greeting Cards.
Video Greetings.
Unusual Gifts.
Arts & Crafts.
Handmade Jewelry.
Gifts for Geeks.
Postcards From..
Recycled Formats.
Other.

**Graphics & Design**

Cartoons & Caricatures.
Logo Design.
Illustration.
eBook Covers & Packages.
Web Design & UI.
Photography & Photoshopping.
Presentation Design.
Flyers & Brochures.
Business Cards.
Banners & Headers.
Architecture.
Landing Pages.
Other.

**Video & Animation**

Commercials.
Editing & Post Production.
Animation & 3D.
Testimonials & Reviews by Actors.
Puppets.
Stop Motion.
Intros.
Other.

**Online Marketing**

Web Analytics.
Article & PR Submission.
Blog Mentions.
Domain Researches.
Fan Pages.
Keywords Research.
SEO.
Bookmarking & Links.
Social Marketing.
Get Traffic.

**Writing & Translation**

Copywriting.
SEO Keyword Optimization.
Creative Writing & Scripting.
Translations.
Transcripts.
Website Content.
Reviews.
Resumes & Cover Letters.

**Advertising**

Hold Your Sign.
Flyers & Handouts.
Human Billboards.
Pet Models.
Outdoor Advertising.
Radio.
Music Promotion.

| | | |
|---|---|---|
| Video Marketing.<br>Other. | Speech Writing.<br>Proofreading & Editing.<br>Press Releases.<br>Other. | Banner Advertising.<br>Other. |
| **Business**<br><br>Business Plans.<br>Career Advice.<br>Market Research.<br>Presentations.<br>Virtual Assistant.<br>Business Tips.<br>Branding Services.<br>Financial Consulting.<br>Legal Consulting.<br>Other. | **Programming & Tech**<br><br>.NET.<br>C++.<br>CSS & HTML.<br>Joomla & Drupal.<br>Databases.<br>Java.<br>Javascript.<br>PSD to HTML.<br>WordPress.<br>iOS, Android & Mobile.<br>PHP.<br>QA & Software Testing.<br>Technology.<br>Other. | **Music & Audio**<br><br>Audio Editing & Mastering.<br>Jingle.<br>SongWriting.<br>Music Lessons.<br>Rap Music.<br>Hip-Pop Music.<br>Narration & Voice-Over.<br>Sound Effects & Loops.<br>Custom Ringtones.<br>Voicemail Greetings.<br>Custom Songs.<br>Other. |

| **Fun & Bizarre** | **LifeStyle** | **Other** |
|---|---|---|
| Your Message On..<br>Extremely Bizarre.<br>Celebrity Impersonators.<br>Daredevils & Stunts.<br>Pranks.<br>Dancers.<br>Just For Fun.<br>Other. | Animal Care & Pets.<br>Relationship Advice.<br>Diet & Weight Loss.<br>Health & Fitness.<br>Makeup, Styling & Beauty.<br>Online Private Lessons.<br>Astrology & Fortune Telling.<br>Spiritual & Healing.<br>Cooking Recipes.<br>Parenting Tips.<br>Travel.<br>Other. | Anything else falls here. |

ඉතින් මේ ලෝකේ ඕනම කෙනෙකුට මොනවම හරි කරන්න පුලුවන් දෙයක් ඔය Fiverr Gig Category 131ක ඇතුලේ තියෙනවා. බැලූ බැල්මට ඔයාට පේන්න පුලුවන් ඔයාට කරන්න පුලුවන් දෙයක් නැහැ වගේ, නමුත් හොඳට හිතුවොත් ඕනම කෙනෙකුට කරන්න පුලුවන් දේවල් 10වත් එනවා.

ඔයාට හොඳට Brainstorm කරන්න ලේසි වෙන්නත් එක්ක තමයි ඔක්කොම Fiverr Gig Categories ටික උඩ දාලා තියෙන්නේ. ඒ නිසා ඒකෙන් හොඳ ප්රයෝජනක් ගන්න. සමහරවිට ඔයා තවත් කෙනෙක් කරන දෙයක් කරන්න යන්න ඇති, ඒත් ඔයාට ඒක ගැන හොඳ අවබෝධයක් නැතුව දිගටම කරගන්න බැරුව, ඔයා නවත්වන්නත් ඇති. ඔයාට ගැළපෙන Fiverr Category එක එහෙම නැත්නම් Niche එක හොයාගන්න මෙහෙම කරන්න.

1. උඩ දීලා තියෙන Fiverr Category 131න් ඔයාට දැනටම Knowledge එකක් තියෙන, ඔයා ගොඩක් ආසකරන(Passion) ඒවා 20ක් විතර වෙනම ලියාගන්න.

2. දැන් ඔය ලියාගත්තු 20න් එකක් අරගෙන, $5ට දෙන්න පුලුවන් පුංචි පුංචි සේවාවන්(Services or Gig Ideas) ටිකක් ලියන්න. උදාහරණයක් විදිහට Online Marketing යටතේ එන Fan Page කියන Category එක ගමුකෝ. මං මෙන්න මේ විදිහේ Services List එකක් ලියනවා මේ Category එකෙන්.

I will Create a Professional Timeline Cover for $5.
I will Create a Business Fan Page for your Company, Website for $5.
I will Design a Custom Opt-In Tab in your Facebook page for $5.
and the list goes on….

මං හිතන්නේ දැන් ඔයාට තේරෙනවා කොහොමද කරන්න ඕන කියලා. ඔය විදිහටම අර වෙනම ලියලා තොරගත්තු Fiverr Category 19නුත් Gig Ideas List එකක් ලියන්න. අඩුම තරමේ එක Fiverr Category එකකට 10වත් ලියන්න උත්සහා කරන්න. දැන් ඔයා Category 20න්ම 10 ගානේ ලිව්වනම් ඔක්කොම Gig Ideas 200 තියෙන්න ඕනා. ඔයාට Fiverr Account එකේ දාන්න පුලුවන් Gigs 20යි, ඉතින් ඔය 200ම දාන්න බැනේ. ඒ නිසා දැන් ඔයා ඒවා ටික Filter කරගන්න ඕනා. ඒක කරන්නේ මෙහෙමයි.

## Awesome Gig Filtering Formula

❶ Gig Filter කරද්දී මුලින්ම කරන්න ඕන දේ තමයි මෙන්න මේ Official Fiverr Pages ටික කියවන එක. ඉංග්රීසියෙන් තමයි තියෙන්නේ, ඒත් කියවන්න ඕනා.
→ Fiverr TOS https://www.fiverr.com/terms_of_service
→ Fiverr Privacy Policy http://www.fiverr.com/privacy-policy

ඔය දෙකේ සිංහල තේරුම් ගැන මම පස්සෙ කියන්නම්, ඒත් ඉතින් English Knowledge එක දියුණු කරගත්තේ නැත්නම් ඔයාටම තමයි පාඩුව වෙන්නේ. හරි, දැන් ඔය දෙකම සම්පූර්ණයෙන් කියෙව්වම ඔයා ලියලා තියෙන Gig Ideas or Services 200න් Terms of Service or Privacy Policy Violate වෙන Gig Ideas or Services කෙලින්ම කපලා දාන්න.

මේ Step එක අනිවාර්යයෙන් කරන්න ඕනා, සමහරවිට මේකේදි අයින් කරන්න පුලුවන් Gig Ideas නැතිවෙන්නත් පුලුවන්, තියෙන්නත් පුලුවන්. කොහොමවුනත් තියෙන ඒවා අයින්කරන එක අනාගතයට හොඳයි.!

❷ පැය 10, 12 වගේ යන ඒවා තියෙනවනම් ඒවත් අයින් කරන්න. මොකද $5ට ඒ වගේ ලොකු වෙලාවක් ගන්නවා කියන්නේ එතන Sales තිබුනට සාර්ථකත්වයක් නැහැ. “Time Is Money” කියලත් තියෙනවනේ, ඉතින් කාලය වැඩියෙන් යොදවන තරමට මුදල් වැඩියෙන් ලැබෙන්න ඕනා. නැතුව $5ට දවසෙම වැඩක් කරන එක නෙමෙයි.

ඒවගේම මේකත් මතක තියාගන්න, මුලින්ම පටන්ගත්තු ගමන් මේ කිව්ව සාර්ථකත්වය හොයන්න යන්න එපා, පටන්ගනිද්දි වැඩි අවධානය තියෙන්න ඕන මුදල් නෙමෙයි, ලැබෙන Sales ගාණ. ඔයාට ලාභ නැතිවුනත් කමක් නෑ, Gigs 3,4ක වැඩක් වුනත් කමක් නෑ. මොකද ඉස්සරහට ඒවත් අල්ලන්න පුලුවන් තරම් Sales එනවා.

❸ සාමාන්‍යයෙන් ඉල්ලුම තියෙන්නේ මොනවටද? සමහරවිට ඔයා කියයි Graphic Designing කියලා, ඔව් Graphic Designing වලට ලොකු ඉල්ලුමක් තියෙනවා, නමුත් ඒක නෙමෙයි ඉල්ලුම තියෙන එකම Industry එක. ඒ වගේම ඒක නෙමෙයි ලොකුම ඉල්ලුම තියෙන Industry එක.


Online Marketing Category එකේ Gigs වලට තමයි වැඩිම ඉල්ලුම තියෙන්නේ, උදාහරණයක් විදිහට Writing, Web Designing & Developing, SEO, Social Media Marketing වගේ තමයි වැඩිම ඉල්ලුමක් තියෙන්නේ. මෙතනදි වෙන්න ඕන Highest Demanded Category එකේ Services දෙන එක නෙමෙයි, ඔයා ලියලා තියෙන Gig Ideas 200න් මොන ඒවටද වැඩිම Demand එක තියෙන්නේ කියලා හොයාගන්න එක. ඊට පස්සේ Demand එක අඩු ඒවා අයින්කරලා දාන්න.

Demand එක වැඩි ඒවා හොයාගන්න පුලුවන් Fiverr එකේම චුට්ටක් Surf කරානම්. Order Queue එක එහෙමත් නැත්නම් Gig එකට බලන වෙලාවේ ඇවිල්ලා තියෙන Orders ලිස්ට් එක බැලුවම බලාගන්න පුලුවන්. ඒ වගේම Demand එක තියෙන Category වලම තමයි එක වගේ Gigs ගොඩක් තියෙන්නේ එහෙමත් නැත්නම් Competition එක වැඩිවෙන්නේ Demand එක තියෙන පැත්තේ.

දැන් ඉතින් Competition එක වැඩියි, මට Order එකක් වත් එන එකක් නැති වෙයි කියලා වැඩේ අතාරින්න එපා. Smart මොලයක් තියෙනවා නම් Competition එක ගැන භය වෙන්න දෙයක් නැහැ.

දැන් ඔය Steps 3ම දාලා Gig Filter කරාම, ඔයාට Gig Ideas ටිකක් ඉතුරු වෙයි. ඒවා තමයි Fiverr එකේ ඔයා දෙන්න යන Services වෙන්නේ.

ඔයාටත් පහළ රූපයේ වගේ ටික කාලයක් යද්දී Direct PayPal or Payoneer Orders ගන්න පුලුවන්, මේ පාඩමේ කියන දේවල් ඒ විදිහටම කලොත්. Direct Orders ගනිද්දී $1 එකට කැපෙන්නේ නෑ(ඒත් PayPal Business Fee එක කැපෙනවා. $10 ගත්තොත් ලැබෙන්නේ $9.31, ඒත් පාඩු නැහැ..!). ඒ කියන්නේ ඔයා $70 Project එකක් Fiverr එකෙන් අරගෙන කලොත් ඔයාට $14 නැති වෙනවා, නමුත් Direct PayPal or Payoneer ගත්තම $14ත් ලැබෙනවා. ඒ වගේම මේ Revenue Proofs දාන්නේ මේවා දකිනකොට ලොකු Motivation, Self Confidence එකක් එන නිසා.


Payments received - May 1, 2013 to May 31, 2013 Print

Move to Recent Activity What's this Payment status glossary

| Date | Type | Name/Email | Payment status | Details | Order status/Actions | Net amount |
|---|---|---|---|---|---|---|
| May 30, 2013 | Payment From | | Completed | Details | Issue refund | $9.31 USD |
| May 28, 2013 | Payment From | | Completed | Details | Issue refund | $9.31 USD |
| May 7, 2013 | Payment From | | Completed | Details | Issue refund | $62.16 USD |

From: 05/01/2013 To: 05/31/2013

Description Search Clear Search



| Date | Description | Debits | Credits |
|---|---|---|---|
| 05/30/2013 06:33 | HATTON NATIONAL BANK | $199.60 | |
| 05/29/2013 21:02 | Private Load | | $170.00 |
| 05/20/2013 03:53 | PP*1401CODE | | $1.95 |
| 05/18/2013 20:27 | Refer a Friend Referrer Reward | | $25.00 |
| 05/13/2013 18:37 | Immediate ACH Corporate Load Fee 6755 | $0.62 | |
| 05/13/2013 18:37 | ACH Corporate Load PAYPAL TRANSFER SHYAM | | $62.16 |

දැන් මං එහෙම කිව්වා කියලා ඔය විදිහට Direct ගන්න යන්න එපා. හැමදේටම System එකක් තියෙනවා. ඒ දේවල් ඉස්සරහට.!

## Fiverr v2 එක්ක Long-Term Fiverr Business එක පටන්ගන්න

කාලෙකට කලින් 2009 අවුරුද්දේ ව්‍යවසායකයන් දෙන්නෙක්ට අලුත් අදහසක් ආවා. ඒ අඩු මුදලකට වටිනාකමක් ඇති සේවයන් පිරිනැමීමයි. මේ ව්‍යවසායකයන් දෙන්න නම්වලින් Micha Kaufman හා Shai Winingerය. මෙයාලට මේ Idea එක ආවාම මෙයාලා කරේ '$5ට සලසන්න පුලුවන් මොනාද' කියන ප්‍රශ්ණය යටතේ එයාලගේ Product එක 2010 වසරේ පෙබරවාරි වලදී වෙළදපොළට Beta Version එකක් විදිහට නිකුත් කලා, ඒ Fiverr(Five-er) කියන නමින්.

මෙන්න මේ විදිහට එයාලට ආපු Idea එක අත්හදා බලපු ඒ අය මේක සාර්තක Business Model එකක් කියන තීරණයට ආවා, ඊට පස්සේ පුන්චි පුන්චි වෙනස්කම් අලුත් Features එකතු කරලා කාලයක් කිසිම සද්දයක් නැතුව හිටියා. ඒ ජූනි මාසේ 26 වෙනි දවස එනකං. මේ දවසේ තමයි Fiverr v2 Design & Features ඔක්කොම මුළු ලෝකෙටම විවෘත වුනේ. ඒ නිසා මේ වෙනකොට ඔයා මේ අලුත් Fiverr v2 Design එක පාවිච්චි කරන එක ගැන නම් කිසිම සැකයක් නැහැ..!

දැන් කියන්න යන්නේ Fiverr Account එකක් හදලා ගින්දර වගේ Professional Gig එකක් හදන හැටි වගේම Fiverr v2 Tools & Features වලින් උපරිම විදිහට වැඩ ගන්න හැටියි, තව වැඩි කලක් ආයුෂ නැති පුන්චි Tips ටිකකුයි.

# First Finger on Fiverr v2

දැන් හැමෝටම Fiverr v2 Officially Release කරලා තියෙන නිසා අලුතෙන් මුකුත් කරන්න දෙයක් නැහැ, මේ කියන්න යන්නේ Fiverr Account එකක් හදන හැටි. හැබැයි ඊට කලින් කියන්න දෙයක් තියෙනවා, ගොඩක් අය ලංකාවේ විදිහට Fiverr Account හදන්න කැමති නැහැ. ප්‍රධාන හේතුව විදිහට කියන්නේ, ලංකාවේ Account වලට Sales එන්නේ නෑ කියලා...!

ඒත් මෙතනදි එහෙම දෙයක් වෙන්නේ නෑ, gigs ටික දාලා බලාගෙන ඉන්න හැමෝටම වගේ Fiverr Sales එන්නේ නැත්තේ එයාලගේ තියෙන Mistakes හින්දා මිසක් ලංකාවේ Flag එක තියන හින්දා නෙමෙයි.

ඔව්, සමහරවිට ඔයා දෙන Service එකට ගැලපෙන්නේ US Fiverr Account එකක් වෙන්න පුලුවන්. ලංකාවේ Fiverr Account එකකට Sales එන්නේ නැත්තේ නෑ, අවශ්‍ය වෙන්නේ හොඳ කැපවීමකුයි මහන්සිවෙලා වැඩ කරන්න පුලුවන් ශක්තියකුයි විතරයි. කොහොමත් US, UK රටවල මිනිස්සුන්ට ලෝකේ අනිත් මිනිස්සුන්ට වඩා සැලකිල්ලක් තියෙනවා. මේ කියන්නේ ඔයා US Account එකක් හැදුවොත් අනිවාර්යයෙන් Sales එනවා කියලා නෙමෙයි, ඒකට පොඩි Influence එකක් තියේවී කියලා.


මොනාවුනත් අන්තිම තීරණය ඔයා අතේ, ඒත් ලංකාවේ Fiverr Account වලට Sales එන්නේ නෑ කියන මිත්‍යාව හිතින් අයින් කරගන්න.

## Simple Registration as a World Wide Freelancer!

මුලින්ම Fiverr.com වලට යන්න, ගිහින් ඔකේ උඩම කොනේ තියන Join Click කරන්න.

### Fiverr v2 Account Creation

ඔය ඉල්ලලා තියෙන දේවල් කරලා Fill කරන්නයි ඕනා, මෙතනදි Username එක තෝරගනිද්දි වැඩේට ගැළපෙන එකක් නම් හොඳයි, ඒ කිව්වේ ඔයා කරන්න ඉන්නේ Video Intro සම්බන්ධ දේවල් නම් Intro කියන වචනයත් එක්ක ඔයාගේ Username එක හදාගන්න පුලුවන්.(eg.IntroSoul) මෙහෙම කරන්න කියලා අනිවාර්ය නැහැ, ඒත් මෙහෙම කලොත් පොඩි SEO Benifict එකක් තියෙනවා.




## Fiverr Activation Email

හරි, ඔයා Join Click කරාම ඔයාට මෙන්න මේ වගේ Confirmation ඊමේල් එකක් එයි. ඒකේ තියෙන Confirmation Link එක කරලා Fiverr Account එක Confirm කරන්න. දැන් ඔයාගේ Fiverr Account එක හදලා ඉවරයි, දැන් තියෙන්නේ Details Fill කරලා වැඩ පටන්ගන්නයි.

## Updating Fiverr v2 Profile…


දැන් ඔයා Fiverr Account එකට ලොග්වෙන්න, එතකොට මේ වගේ Interface එකක් එයි.




## Fiverr v2 Account Dashboard

තාම ඔයාගේ Fiverr Account එක හැදුවා විතරයි, ඉතින් ඔකේ Gigs දාන්න කලින් කරන්න ඕන දේවල් කිහිපයක් තියෙනවා. ඒ,

1. Fiverr Profile එකට හොඳ පින්තූරයක් දැමීම.
2. Fiverr Profile එකට About Description එකක් දැමීම.
3. ඔයාගේ Facebook Account එක Fiverr Account එකත් එක්ක Link කිරීම.
4. PayPal Account එක Associate කිරීම.




## Fiverr v2 Account Settings Path

අලුත් Fiverr v2 Design එකේ Profile Image එක ටිකක් ලොකුයි, ඒත් හරියටම Image Size එක ගැන Fiverr Settings Page එකේ කියලා නැහැ. නමුත් ඔයාගේ Image Size එක වෙන්න ඕනා 250px*250px. එහෙම කියන්නේ Image Size එක Check කරලා බලලා. මේ Profile Image එකට මොනාහරි එකක් දාන්න එපා. ඔයා කරන්න ඉන්න වැඩේට සම්බන්ධ විදිහේ Image එකක් අලුතෙන්ම හදලා දාන්න.

Fiverr Editorsලා කැමතියි Fiverr Logo එක ඔයා නිතරම පාවිච්කරනවනම් ඒ නිසා ඔයාගේ Fiverr Profile Image එකට Fiverr එකේ Official Logo එකත් එකතුකරන්න.

වෙනත් තැන්වලින් මේ Fiverr Logo එක ගන්න ඕන නැහැ, එයාලගේ Press kit එකෙන්ම Original Quality Logo එක ගොඩක් Formats & Sizes වලින් ගන්න පුලුවන්, ගිහිල්ලම බලන්නකෝ.

1. **Fiverr Profile එකට About Description එකක් දැමීම.**




## Fiverr v2 Profile About Description

මෙතන ලියන්න ඕනේ ඔයා ගැන පුන්චි විස්තරයකුයි, ඔයා කරන්න ඉන්න Services මොනවද කියලා. මොනා කරන්නත් තියෙන්නේ අකුරු 300ක ඉඩක් විතරයි. දන්නවද... <u>SEO</u> වලින් මේක දිහා බැලුවොත් ඔයා මෙතන ලියන About Description එක තමයි ඔයාගේ Fiverr Account එකේ Meta Description එක, වෙනත් විදිහකින් කිව්වොත් Search Engine Result එකේ එන පුන්චි විස්තරය තමයි මේක.


ඔයා Search Optimized About Description එකක් ලියනවා නම් ඔය අකුරු 300, අකුරු 150ට අඩු වෙනවා. මොකද Google එකේ Meta Description එකට උපරිම ගන්නේ

160 නිසා. මේ වගේ තව SEO Tips තියෙනවා Fiverr එක්ක පාවිච්චි කරන්න පුලුවන්, ඒවා වෙනත් පෝස්ට් එකකින් තමයි කියන්න ඉන්නේ.

වචන වලින් ගොඩක් දේවල් කරන්න පුලුවන්, කාලයක් අර Fiverr eBook එකේ තිබුන About Description එක හැමෝම දැම්මා, ඒ About Description එක දැන් නිකන් Rape වෙලා වගේ..!! ඔයා තාමත් ඒක නම් පාවිච්චි කරන්නේ දැන් ඒක ඔයාගේම ලස්සන About Description එකකට මාරු කරගන්න. ඔව් ඒ Description එක Nice Creative වැඩක්, නමුත් දැන් ඒක හැමෝම පාවිච්චි කරන සාමාන්‍ය දෙයක් වෙලා.

හැමෝම කරන දේ ඔයත් කරන එක කවදාවත් 'Unique' කියන වචනය ඇතුලට ගන්න බැහැ. ඒ වගේම Interner Marketing වල සාර්ථක වුන මිනිස්සු ඔක්කොම වගේ Unique Ideas ගැන හිතන්න පුලුවන් අය. ඉතින් ඔයා ටිකක් හිතන්න ඔයාට කොයි වගේ දෙයක් ලියන්න පුලුවන් වෙයිද කියලා. ඔයා සමහරවිට Internet Marketing දිහා Simple ඇහැකින් බලනවා ඇති, ඒත් මේක ඔහේ කරන්න පුලුවන් දෙයක් නෙමෙයි, හොඳ StartUp එකක් ගන්න නම් Unique විදිහට හිතන්න ඕනා. ඒ විදිහට හිතපු මිනිස්සු තමයි අද ලෝකෙම ආදරය කරන පට්ට Company නිර්මාණය කරලා තියෙන්නේ.

**2. ඔයාගේ Facebook Account එක Fiverr Account එකත් එක්ක Link කිරීම.**




Name, PayPal + Facebook Connect Page

මේක අලුත් Fiverr v2 වල ආපු අලුත් Feature එකක්. මේක කරන්න අනිවාර්ය නැහැ, කරන එකෙන් මොනාහරි Influence එකක් තියෙනවා කියලා තමයි හිතෙන්නේ.

**3. PayPal Account එක Associate කිරීම.**

ඔයාගේ Fiverr Earnings Withdraw කරන්න පුලුවන් PayPal Account එකකට, ඉතින් PayPal Email එක Fiverr Account Settings Page එකේ දාලා Save කරන්න. සමහරවිට ඔයා Pyoneer card එකට මේ මුදල් ගන්න කැමති ඇති. ඒත් Payoneer Card එකකට Withdraw කරන්න පුලුවන් වෙන්න නම් අඩුම තරමේ ඔයා Fiverr Level 1වත් වෙන්න ඕනා. ඔයාට මුදල් ගෙදරට ගන්න අවශ්‍ය නම් Fiverr Level 1 වෙලාම Withdraw කරන එක තමයි හොඳ.

හරි, දැන් මේ දේවල් ඔක්කොම කලාම Fiverr System එකේ ඔයාගේ Account එක Safe Zone වෙනවා. Fiverr Business එක පටන්ගන්න කොට Fiverr System එකට ඔයා Professional කියලා පෙන්වන්න ඕනා වගේම ඔයා එහෙම Fiverr System එකට පෙන්වනකොට Fiverr Visitorsලටත් නිකන්ම පේනවා.

කවුරුත් කැමති නෑ අහසින් පාත් වෙච්ච කෙනෙක් එක්ක එකපාර ගණුදෙනුවක් කරන්න. ඉතින් ඔයා ඇත්තම කෙනෙක්, ඔයා මේ දේවල් වලට දක්ෂ කෙනෙක් කියලා පෙන්වන්න ඕනා. Fiverr Profile Image එකයි, Fiverr Profile Description එකයි කියන දෙක Visitor කෙනෙක්ගේ විශ්වාසය ගන්න උදව් වෙනවා වගේම ඔය ඔක්කොම දේවල් Fiverr System එකේ විශ්වාසය ගන්න උදව් වෙනවා.

තව ගොඩක් දේවල් Fiverr Business ගැන කියන්න තියෙනවා, ඒවා ඉස්සරහට ලියන ලිපිවලින් කියවන්න පුලුවන්.

# Fiverr V2 Features වලින් උපරිම ප්‍රයෝජන ගන්න

අන්තර්ජාලයෙන් මුදල් උපයන්න අලුතෙන් එන ගොඩක් අය දැන් Fiverr වලින් එයාලගේ ගමන පටන්ගන්නවා. ඒක ගැන ගොඩක් සතුටුවෙන්න පුලුවන් මොකද Fiverr වලින් පටන්ගන්න අයට ඉක්මනින්ම හොඳ ප්‍රථිපළ ලබාගන්න පුලුවන්. ඒ වුනත් Fiverr කියන්නේ අන්තර්ජාලයෙන් මුදල් උපයන්න පුලුවන් තවත් එක ක්‍රමයක් විතරයි, මෙහෙම කියන්නේ අන්තර්ජාල අලෙවිකරණය, Fiverr විතරක්ම කියලා ඔයාට හිතුනනම්.

මාස කිහිපයකට කලින් Fiverr එයාලගේ Marketplace එකට අලුත් පෙනුමක් එක්කම අත්‍යවශ්‍ය Features ටිකකුත් ලබා දුන්නා. සමහරවිට ඔයාට මේ දේවල් වලින්

කරන්නේ මොකක්ද කියලා තේරෙන්නේ නැතුව ඇති, එක්කෝ ඔයාට ඒ දේවල් වලින් ගන්න පුලුවන් දේ ගන්න අවශ්‍යතාවයක් නැතුව ඇති. මේ කොහොම වුනත් Fiverr V2 Features වලින් ඔයා හිතනවට වඩා දෙයක් කරගන්න පුලුවන්. ඒක කරන්නේ මෙහෙමයි....

තවත් වැදගත් දෙයක් තියෙනවා මාස 3කට කලින් Fiverr තිබුනේ Alexa Rank 300යේ නමුත් එයාලා Fiverr V2 එක්ක ලොකු Marketing Strategy එකකුත් පාවිච්චි කලා. දැන් Alexa Rank වල Fiverr මාස ගාණක් තිස්සේ 130ට අඩුවෙන් තියෙනවා. සමහරවිට ඔයාටම දැන් තේරෙනවා ඇතිනේ කලින් තිබුන Fiverr Revenue Potential එකට වඩා 3න් ගුණයක්වත් මේ වෙනකොට වැඩියි කියලා.

# Fiverr V2 Features, Buyer Requests

Buyer Requests කියන්නේ Fiverr එකට එන Potential Customerට එයාට අවශ්‍ය දේ මේකයි කියලා, ඒ වැඩේට ගැළපෙන කෙනෙක් හොයාගෙන කරගන්න අවස්ථාවක් දීලා තියෙන Feature එකක්.

මේක තමයි Fiverr වල තිබුන හොඳම Feature එක, ඒත් ඒ වටිනාකම Fiverr V2 Launch වෙනවත් එක්කම නැතිවෙලා ගියා. ඔයාට මතකද කලින් Buyer Requests වැඩ කරපු විදිහ, නමුත් දැන් ඒක එහෙම නෙමෙයි. කලින් Buyer Requests වලදි ඔයාට ඕන විදිහට Gig Offer එකට Message කරන්න අවස්ථාව ලැබුනා. අවාසනාවට අලුත් Buyer Requests වලදී ඔයාට බැහැ Offer Message එක ලියන්න, කරන්න තියෙන්නේ ගැළපෙන Gig එක තෝරලා Send Offer Click කරන එක විතරයි.

ඒ විදිහට යවන Offer Message එක කිසිම වැඩක් නැහැ, මොකද එහෙම යවන Message එකේ Conversion Rate එක හොඳටම අඩුයි. මෙහෙම කියන්නේ මං කලින් Buyer Request වලදී යවපු Offer Message 10න් 4ක්වත් Sale එකක් වුන නිසා.

# Fiverr V2 Buyer Request Send Offer

ඒත් මේකට පුන්චි දෙයක් කරාම හරි. ඔයා Auto Offer Message එක යවලා ඉවර වුනම ආයෙත් ගිහින් වෙනම Message එකක් යවන්න එතකොට ඒක Sale එකක් වෙන්න ලොකු Possibility එකක් තියෙනවා. මං පාවිච්චි කරන්නේ මේ විදිහේ Offer Message Structure එකක්. ගොඩක් අය Sir කියලා තමයි Customerට ආමන්ත්‍රණය කරන්නේ, නමුත් එතන තියෙන්නේ වාසියක් නෙමෙයි. එහෙම කිව්වම Customerට අපි ගැන

විශ්වාසයක්, මෙයා මේ Field එකෙන් Professional කෙනෙක් කියන හැඟීම ඇතිවෙන්නේ නෑ. ඒවගේම සමහර අය Order එක දෙන්න කියලා බැගෑපත් වෙනවා, ඒකත් හොඳ දෙයක් නෙමෙයි. මොකද Professional Online Service Provider කෙනෙක් කවදාවත් Sale එකක් ඉල්ලගෙන පස්සෙන් යන්නේ නෑ. විනීතව තමන්ගේ තැන තියාගෙන Offer Message එකක් යවන එකයි කරන්නේ.

මං මේ කියන්නේ Sir කියලා කියන එක වැරදියි කියලා නෙමෙයි, ඒක පාවිච්චි කරන විදිහයි, අරමුණයි වැරදි. හොඳයි මේ තියෙන්නේ මගේ Structure එක.

Hi [Username],
I saw your Gig Offer of [එයාට ඕන වැඩේ] and I'm willing to help you in getting this done.
[මෙතන ඔයා වැඩේ කරන්නේ කොහොමද කියලා පුන්චි විස්තරයක් දාන්න]
Please let me know, If you're interested in working with me.

Thank You,
[Your Name]
[Your Position]

Fiverr Sales Analytics

මේක ටිකක් වැදගත් එකක් මොකද Online Marketing වලදී Analytics කියන්නේ අත්‍යවශ්‍යම දෙයක්. කෙටියෙන්ම, මේකේන් වෙන්නේ Fiverr Account එකේ Sales වල විස්තර පෙන්වන එකයි. ඒවගේම ඔයා හොයන මුදල් ප්‍රමාණය, ඔයාගේ Gigs ප්‍රසිද්ධ රටවල් වගේ ගොඩක් දේවල් මේකෙන් පෙන්වනවා.

# Fiverr Sales Analytics Information

හරි දැන් වැදගත්ම දේවල් ටික චුට්ටක් විස්තර කරන්නම්

AVG. Selling Prize – මේ කියන්නේ ඔයාට එන සාමාන්‍ය Sale එකක ගාණ. ඔයාගේ Gigs වල තියෙන Gig Extras නිතරම Buy කරනවා නම්, ඔයාට Multiple Gig Unit Sales එනවා නම් මෙතන $5ට වඩා ලොකු ගාණක් තියෙන්න ඕනා.

Delivered Orders – මෙතන පෙන්වන්නේ ඔයා Deliver කරන Orders ගාණ, මේක ඔයාගේ Public Fiverr Profile එකෙත් පෙනවනවා ඒ නිසා පුලුවන් තරම් එන Orders හැමදාම Deliver කරන්න, එක දවසක්වත් නොකර ඉන්න එපා Orders තියෙනවා නම්. මොකද, හැමදාම Deliver කලොත් ඔයාට ලොකු Demand එකක් තියෙනවා කියලා පේනවා.

පුලුවන් හැම වෙලාවෙම ඔයාට එන Order එකක් කිසිම විදිහකින් Cancel වෙන්න දෙන්න එපා. හැබැයි එහෙම කියලා Negative Reviews තියාගෙන ඉන්න එපා. Buyer වැඩේට අකමැතිම නම් සල්ලිත් එපා බඩුත් එපා කියලා පැත්තකට වෙන එක අනාගතේට හොඳයි. කලාතුරකින් තමයි ඒ වගේ Buyersලා එන්නේ.

Responsiveness – මේක තමයි මෙතනින් වැදගත්ම දේ. Perfect Communication එකක් නැත්නම් කවදාවත් ඔයාට සාර්ථකව Online Marketing කරන්න බැහැ. මොකද පරක්කු වෙලා Reply යවනවා කියන්නේ Customerගේ උපරිම අවතක්සේරුවට ලක්වෙන දෙයක්. මට ආපු ලොකු Orders පවා Cancel වෙලා තියෙනවා Communication එක Constant Level එකක තියාගන්න බැරිවුන හින්දා.

මෙතන Responsiveness එක ඔයාගේ Public Fiverr Profile එකේ පෙන්වනවා ඒ කියන්නේ ඔයා කොච්චර Communication එක ගැන හිතනවද කියලා ඕන Potential Customer කෙනෙකුට එක තත්පරයකින් හිතාගන්න පුලුවන්. මේකට හොඳම හා එකම විසඳුම එන හැම Message එකකටම ඒ වෙලාවෙම Reply කරන එක. මෙතනදි ඔයාගේ Gig එකක් සම්බන්ධව එන Messages වලට තමයි එහෙම ඉක්මනින් Reply කරන්න ඕන. එතකොට මේ Responsiveness එක අඩු වෙයි.

# Fiverr Sales Analytics Map & Revenue

Richer Bar – මෙතනදි ඔයා Fiverr එකට Join වුන දවසේ ඉඳලා Earn කරන ගාණ පෙන්වනවා. එකතු කර කර ඉන්න අවශ්‍ය නැහැ ඉක්මනින්ම Total Revenue එක බලාගන්න පුලුවන්.

Pageviews – ඔයාගේ Fiverr Profile එක බලන්න ආපු ගාණ තමයි මෙතන පෙන්වන්නේ. ඔයාගේ Gigs වලට එන Pageviews මෙතනට අදාල නැහැ.

Conversion Rate – මේක තමයි මෙතන වැද්ගත්ම එක. මේ කියන්නේ ඔයාගේ Profile එකට ආපු අයගෙන් කීදෙනෙක් ඔයාගේ Customersලා වුනාද කියලා ප්‍රතිශතයකින්.

ඔයාට පුලුවන් මේ Conversion Rate එක වැඩි කරගන්න හොඳ Quality Gigs, Profile Description වගේම පට්ට OffSite Self-Promotion එකක් කරලා.

Customer Map – ඔය Map එකෙන් පෙන්වන්නේ ඔයාගේ Gigs අරගෙන තියෙන රටවල් ගාණ. සාමාන්‍යයෙන් වැඩියෙන්ම Buy කරන්නේ United States වලින් තමයි.

# Fiverr To Do Page

ඕනම ලොකු Goal එකකට ගමන් කරන පුද්ගලයකුට To-Do List එකක් නැත්නම් ඒ කෙනාගේ ඵලදායිතාව ගැන ප්‍රශ්ණයක් ඇතිවෙනවා. To-Do List එකක් හදාගෙන ඒ අනුව වැඩ කරන කෙනෙකුට හොඳ සාර්ථකත්වයක් ලබාගන්න පුලුවන්. To-Do List එකකින් වාසි ගොඩක් තියෙනවා හැබයි ඒවා වෙනත් පෝස්ට් වලට මාතෘකා නිසා පස්සේ කතා කරමු.

Fiverr V2 වලදී To Do Page එකේ පෙන්වන්නේ ඔයා විසින් අනිවාර්යයෙන් කළයුතු දේවල් ලිස්ට් එකක්. ඔයා එතන පෙන්වන එකක් හරි නොකරොත් ඒක ඔයාට ලැබෙන OnSite Fiverr Promotion එකට බලපානවා. වෙනත් විදිහකින් කිව්වොත් ඔයාට ලේසියෙන් Sales ලැබෙන්නේ නැහැ. මෙතන ඉතින් කරන්න කියන්නේ එන Messages වලට Reply යවන්න, Rate කරපු Customerට Rate කරන්න, ආපු Orders Deliver කරන්න වගේ දේවල් තමයි.

# Fiverr V2 Gig Stats

මෙතන තමයි ඔයාගේ එක එක Fiverr Gig එකේ Performance බලාගන්න පුලුවන් හොඳම තැන. මෙතන මෙන්න මේ දේවල් තමයි පෙන්වන්නේ.

1. Impressions – මේ කියන්නේ ඔයාගේ Gig එක Fiverr Site එක ඇතුලේ කොහේ හරි(eg. homepage, search listing) පෙන්වපු වාර ගාණ. වැඩි ගාණක් පෙන්වනවා කියන්නේ Fiverr System එකෙන් Gig එකට Support කරනවා කියන එකයි.

2. Clicks – මෙතන පෙන්වන්නේ එහෙම Gig එක පෙන්වපු වෙලාවලදී ඒක Click කරපු ගාණ. ඇත්තටම Gig එක බැලුවත් නැතත් මෙතන Click එක Count වෙනවා.

3. Pageviews – මේ තීරුවේ පෙන්වන ගාණ කලින් එකට වඩා අඩු වෙන්න ඕනා නිතරම, මොකද අර විදිහට Gig එක Click කරලා එන හැම කෙනාම Gig එකත් එක්ක Engage වෙන්නේ නෑ. ඒ කියන්නේ එහෙම එන කෙනා වැඩි වෙලාවක් Gig Page එකේ ඉන්නේ නැතුව ඉක්මනින් ගියාම ඒක Pageviews වලට අයත් වෙන්නේ නෑ. කෙටියෙන්, ඒවා තමයි Bounces කියන්නේ.

4. Purchases – Pageviews වලට අයත්වෙන කෙනෙක් තමයි අනිවාර්යයෙන් ඔයාගේ Customer කෙනෙක් වෙන්නේ ඉතින් එහෙම ඔයාගේ Customersලා වෙන ගාණ තමයි මෙතන පෙන්වන්නේ. එක Pageview එකක් ඇවිල්ලා ඕන තරම් Purchases වෙන්න පුලුවන් මොකද Gig Extras හා Multiple Gig Units කියන දේවල් තියෙන නිසා.

5. Conversion Rate – මේ තියෙන්නේ Gig එක බලන(Pageviews) කට්ටියගෙන් ඔයාගේ Customer කෙනෙක් වෙන ප්‍රතිශතය. මේක වැඩියි කියන්නේ ඔයා Fiverr Gig එක හදනකොට පට්ට වැඩක් කරලා තියෙනවා කියන එකයි.

ඔයා Gig එකට කරන හැම Tweak එකකින්ම ප්‍රථිපලයක් තියෙනවද කියලා මේ තොරතුරු වලින් තීරණය කරන්න පුලුවන්.

# Maximum Optimized Killer Fiverr Gig Creation

අද වෙනකොට ගොඩක් දෙනාගේ එකම අන්තර්ජාල ආදායම Fiverr බවට පත් වෙලා තියෙනවා, ඒ වගේම ගොඩක් අයට මේක පටන්ගන්න ඕනකම තිබුනට පටන්ගන්නේ කොහොමද කියලා දන්නේ නැතුවත් ඉන්නවා. තවත් අය දැනගන්න ඕන දේවල් ඔක්කොමත් වගේ දැනගෙන නොකර ඉන්නවා. ඉගෙනීම කියන්නේ Game එකෙන් භාගයක් විතරයි, ඉතුරු භාගය වෙන්නේ ඔයා ඒ ඉගෙනගත්තු දේ පාවිච්චි කරන එකයි. ඒ නිසා මම කියල දෙන Killer Fiverr Gig Creation Strategies ටික දිගටම පිළිපදින්න.

**"Learning Is Not Useful Without TAKING ACTION"**

අන්තිමට කිව්වේ ඔයාගේ දක්ෂතාවය, ආශාව මත කරන්න පුලුවන් දේවල් හොයාගන්නේ කොහොමද කියලා. දැන් ඔයා කරන්න ඕනේ ඒ Filter කරලා අන්තිමට ආපු Gig Ideas List එකෙන් Gig Idea එකක් තෝරගෙන හොඳට Convert වෙන Killer Fiverr Gig එකක් හදන එකයි.

මෙතනදි Convert වෙනවා කියලා කියන්නේ Fiverr Gig එකට හොඳට Sales එන එක. වෙනත් විදිහකින් කිව්වොත් Fiverr Gig එක නිකමට හරි දකින පුද්ගලයෙක්ව – මෙතනදි මෙයා නිකන්ම Fiverr Gig Visitor කෙනෙක් විතරයි, Gig එක කියවලා බැලුවම Customer කෙනෙක් විදිහට වෙනස්(Convert) වෙන එකයි. මේකෙදි බලපාන සාධක කිහිපයක් තියෙනවා. ඒවා Improve කරලා තමයි මේ Conversion Rate එක වැඩි කරන්නේ.

ගොඩක් වෙලාවට අන්තර්ජාලයෙන් මුදල් හොයනවා කියන එක පේන්නේ නිකන් මැජික් වගේ ලැබෙනවා කියලා. ඒත් මෙතනදි වෙන්නේ එහෙම මැජික් එකක් නෙමෙයි, මෙතනදි වෙන්නේ Business එකක්. ඔයා මේ මුදල් හොයන්න යන්නේ තවත් කෙනෙකුට සේවයක් පිරිනමලා. ඉතින් කොහොමහරි Fiverr Gig 2-3ක් දාලා Sales එනකන් බලාගෙන ඉන්න එක නෙමෙයි කරන්න ඕනේ. දාන එක Fiverr Gig එක හරි උපරිම විදිහට දාන්නයි ඕනේ.

## Key-Points of a Highly Converting Fiverr Gig

ඔයා දාන Gig එක හොඳට Sell වෙන්න නම් සාධක කිහිපයක් බලපානවා, ඉතින් ඔයාට මේ සාධක වලින් පාලනය කරන්න පුලුවන් දේවල් උපරිම විදිහට ඔයාගේ වාසියට පාවිච්චි කලොත් හොඳට Sales ගන්න පුලුවන්.

1. Demand. – කියන්නේ ඉල්ලුමට, කලින් පාඩමේ කිව්වේ මේක Improve කරන්න පුලුවන් උපරිම විදිහට කරන්නේ කොහොමද කියලා. ඒ වගේම මෙතනදි සැලකිලිමත් වෙන්න ඕනා වැඩිම ඉල්ලුම තියෙන දේ කරන්න ගිහින් අමාරුවේ නොවැටී, ඔයාට කරන්න පුලුවන් දේවල් වල උපරිම ඉල්ලුම තියෙන සේවාවන් දෙන එක.

2. Professionalism. – වැඩක් කරනකොට ඒකේ Mistakes තියන එක ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි. ඔයා පිරිනමන සේවය පිළිබඳව මුල ඉඳලා අගට වෙනකන් දැනගෙන ඉන්න එක ගොඩක් හොඳයි, ඒ වගේම මේක ඔයාට තියෙනවා කියලා Fiverr Gig Visitorට පෙන්වන්න ඕනා.

3. Attractiveness – ලස්සන දේවල් වලට හැමෝම කැමතියි, මේ ලස්සන කියන දේ ඔයාට Fiverr Business එකේදිත් ගොඩාක් වැදගත් වෙනවා, මොකද ඔයා ගණුදෙනු කරන්නේ තවත් මනුස්සයෙක් එක්ක. ඔයාට ලස්සන කියන එක පින්තූර වලින් කෙනෙකුගේ ඇස් වලට දෙන්න පුලුවන්, වචන වලින් හිතට දෙන්න පුලුවන්. මෙතනදී පුලුවන් හැමදේම කරලා Fiverr Gig Visitorගේ අවධානය ඔයාගේ Gig එකට ගන්න එකයි වෙන්නෙ.

දැන් ඔයා මේ 3න් පළවෙනි එක සම්පූර්ණ කරලා ඇති, කලින් ලිපියේ විදිහට කරා නම්. දැන් තියෙන්නේ ඉතුරු 2ක සම්පූර්ණ කරන්න.

## Killer Fiverr Gig Creation

සාමාන්යයෙන් කෙනෙක් Fiverr Gig එකක් දානකොට කොහෙන්හරි Gig Idea එකක් අරගෙන, මොනාහරි Image එහෙකුත් එක්ක පුන්චි Gig Description එකක් ලියලා තමයි දාන්නේ. නමුත් එහෙම හදන Fiverr Gig එකක අඩුපාඩු ගොඩයි, විශේෂයෙන් ඒ වගේ Gig එකක ඉලිප්පිලා පේන්නේ Sellerගේ Concentration එක නැතිකමයි.

ඉතින් ඒ වගේ Gig එකක් විකිණෙයිද..? ඔව් විකිණෙයි, හැබැයි හැමදාම නෙමෙයි ඒ වගේම ඒ First Time Luck එක වගේ දෙයක් හින්දා වෙන්නත් පුලුවන්...!!!

Fiverr Gig එකක් උපරිම විදිහට Optimize කරද්දී ප්‍රධාන අංග ටිකක් තියෙනවා හිතන්න ඕන. ඒවා තමයි,

1. Gig Title.
2. Gig Images.
3. Gig Video.
4. Gig Description.
5. Gig Tags.

ඔය කිව්ව දේවල් වලට තමයි ඔයා වැඩි අවධානය යොදවන්න ඕනා. ඔය අංග 5 Maximum විදිහට Optimize කරන Fiverr Gig එකක් විකිණෙන්නේ නැතිවෙන්න බැහැ. ඉතින් මේ පාඩමෙන් කියන්නේ අර කලින් කිව්ව Gig Filtering Method එකට අනුව හදාගත්ත Gig Ideas List එකේ තියන Ideas 20ටම Maximum Optimized Killer Fiverr Gig 20ක් හදාගන්න හැටියි.

## Fiverr Gig Title Creation Technique

ඔයා Gig එකක් දාද්දි මුලින්ම ලියන්න තියෙන්නේ Gig එකේ Title එකයි. Fiverr Gig Optimize කරද්දී හිතන්න ඕන අංග 5න් මුල් තැනක් Fiverr Gig Title එකට හිමිවෙනවා. මොකද ඒක තමයි කෙනෙක් මුලින්ම දකින්නේ, මොනාහරි දෙයක First Impression එක වාටර් නම් ඒක ගැන තව දුරටත් හොයන්න ඔයා පෙළඹෙන්නේ නෑනේ..? ඒ වගේම තමයි ඔයාගේ Gig Title එක අවධානය ගන්න තරම් Powerful නැත්නම්, එතනින් එහාට Visitor කෙනෙක් එන්නේ නෑ කියන එකයි.

Title එකක් ලියද්දී ඔයා හිතන්න ඕනා Buyer කෙනෙක් විදිහට, මොකද ඔයා තාම Online Marketing කරන්න පටන්ගන්නවා නම් ඔයාට හොඳ Attractive Titles ලියලා පුරුදු නැතිව ඇති. ඒත් ඔයාගේ තියෙන Buying Interest එක පාවිච්චි කරලා 'මේක විකිණෙයි' කියලා කියන්න පුලුවන් Titles ටිකක් හොයාගන්න පුලුවන් වෙයි. ඒ කොහොම වුනත් නිතරම Fiverr Gig Title එකක් ලියද්දී මේ දේවල් එකේ තියෙනවද කියලා බලන්න.

1. Title එකක් කියන්නේ ලියලා තියෙන දේ ගැන හෝ පිරිනමන සේවය ගැන එක වාක්යයකින් විස්තර කරන දෙයක්. ඉතින් ඔයාගේ Gig Title එක ඔයා මොනවද දෙන්නේ කියලා ගොඩක් පැහැදිලි Idea එකක් දෙන්න ඕනා කියවන කෙනාට.

2. ගොඩක් Fiverr Sellersලා දිග Titles ලිව්වා කාලයක්, හැබැයි දැන්නම් එහෙම කරන්න බැහැ. එහෙම කරන්නත් එපා, මොකද Title එකක් කියන්නේ තවත් එක ජේදයක් නෙවෙයි. Fiverr Gig Title එකක් නිතරම කෙටියෙන් හා පැහැදිලිව ලියන්න පුලුවන් නම් එතන තමයි දක්ෂතාවය තියෙන්නේ.

ඔයා Gig Title එකෙන් කරන්න ඕනා කොහොමහරි අවධානය අරගෙන Gig Surferව ඊළඟ Step එකට පොළඹවන එකයි. කියවන කෙනා Title එකට කැමතිනම් එයා ඔයාගේ සේවයේ වැඩි විස්තර කියවන්න ඇතුලට එනවා.

Good Examples:
I will write 500 Word Highly TARGETED Search Optimized Article from $5.

ඇයි මේක හොඳ Title එකක් වෙන්නේ..? මොකද මේ වචන 8 Gig Title එක කියෙව්වම මේ Article Writing Service එක ගැන ලොකු Image එකක් මැවෙනවා. මෙයා දෙන්නේ වචන 500ක Search Engine වල හොඳට Rankකරන්න පුලුවන් Targeted Article එකක්. මෙතනදි Service එක මොකක්ද වගේම Gig Visitorට පොඩි Motivation එකකුත් දීලා තියෙනවා ඇතුලට ඇවිත් බලන්න කියලා.

ACTION POINT: ඔයා හදාගත්තු Gig Ideas 20න් එකක් අරගෙන උඩ කිව්ව විදිහට Gig Title එකක් නෙමෙයි 5ක් විතර හදාගන්න. හැබැයි ඔය 5ම කියෙව්වම Service එක මොකක්ද කියලා තේරෙන්න ඕනා. මේ විදිහට 5ක් ලියන්නේ Fiverr Gig 5ක් දාන්න නෙමෙයි, එක පාරින්ම ලියන දෙයක් Perfect නැති වුනාට එකම දේ 5ස් විදිහකින් ලියන්න ගියාම ගොඩක් හිතලා ලියන නිසා එතනින් 1ක් හරි Perfect Gig Title වෙනවා.

මේ විදිහට අනිත් Gig Ideas 20ටම Titles 5ගානේ ලියාගෙන හොඳම Titles 20 තෝරගන්න.

# Fiverr Gig Images Creation Technique

Fiverr Gig Images කියන්නේ ගොඩක් අය හරියට පාවිච්චි කරන්නේ නැති වැදගත් දෙයක්. ඔයාට Fiverr Gig එකකට Images 3ක් දාන්න පුලුවන්, ඒ වගේම මේ එක Gig Image එකක Size එක වෙන්නේ 682px * 459px. ඒත් ගොඩක් අය Google එකෙන් Images හොයාගන්න නිසා මේ Size එකටම ගැළපෙන Images ලැබෙන්නේ නෑ. තවත් සමහර අය Images 3ක් දාන්න පුලුවන් වුනත් දාන්නේ 1යි. ඒ විදිහට කරන එක ඒ තරම් හොඳ දෙයක් නෙමෙයි.

1. හැම Fiverr Gig එකටම 682px * 459px Size එකෙන් Quality Gig Images 3ක් හදලා දාන්න.
2. Fiverr Logo එක, "Exclusively on Fiverr.com" කියන Phrase එක හැම Image එකේම හොඳට පේන තැනකින් දාන්න.
3. Gig Image එක පුලුවන් උපරිමයෙන් ලස්සන කරන්න බලන්න.
4. Fiverr Gig Images 3ම එක සමාන වෙන්න බැහැ, ඒ නිසා ඔයා Service එක ගැන කියන්න ඕන හැමදෙයක්ම Images 3න් කියන්න ඕනා.
5. Gig එකේ ප්රධාන Features ටික, ලැබෙන Bonuses මොනාද වගේ දේවල් අනිවාර්යෙන් සඳහන් කරන්න.
6. වැදගත්ම දේවල් ටිකක් Highlight කරන්න.
7. "ඇයි ඔයා මගේ Gig එක ගන්න ඕනා", "අරගෙන මොනාද කරන්න පුලුවන්", "මගේ සේවය ගැළපෙන්නේ මොනවගේ අයටද" කියන දේවල් ගැනත් සඳහන් කරන්න.
8. පුලුවන් තරම් ඔයාගේ සේවයේ තියෙන වාසි ගැන වගේම ඔයාගේ Fiverr Gig එක Sell වෙන්න බලපෑමක් ඇතිකරන හැම Point එකක්ම Gig Image එකේ දාන්න බලන්න.

මං Fiverr Gig Images ටික හදනකොට පාවිච්චි කරන්නේ Photoshop තමයි, ඒත් මං Professional Graphic Designer කෙනෙක් නෙමෙයි Blog Post, Fiverr Gig වලට හදාගන්න ඕන නිසාම Photoshop කර කර ඉඳලා දැන් ගොඩක් දේවල් කරගන්න පුලුවන්. සමහරවිට ඔයාට Photoshop ගැන කිසිම දෙයක් නොදන්නවත් ඇති, එහෙම කියලා Gig Images හදන්නේ නැතිව ඉන්න එපා, කොහොමහරි උත්සහා කරලා හදන්න.

Internet තියෙන ලෝකේ කවුරුත් කියලා දෙන්න ඕනේ නැහැ කිසිම දෙයක්, ඔයාට පුලුවන් තනියම හොයාගෙන ඉගෙනගන්න.

ACTION POINT: ඔය උඩ කිව්ව හැම ලක්ෂණයක්ම දාලා සුපිරි විදිහේ Fiverr Gig Images 3ක් හදාගන්න. Gig Ideas 20ම Gig Images 60ක් හදාගන්න බලන්න. අනිත් කට්ටිය දාලා තියෙන Fiverr Gig Images බලන්න, ලංකාවේත් ගොඩක් Graphic Designersලා පට්ට Gig Images දාලා තිබුනා, ඒවා මෙතන දැම්මේ නැහැ. කොහොමහරි ලස්සන Design එකක් දාලා උපරිම Details දෙන්න බලන්න.

## Fiverr Gig Video Creation Technique

Fiverr එකෙන් Gigs වලට Video එකක් දාන්න පුලුවන් Feature එක Launch කරපු දවසේ ඉඳලා අද වෙනකන්ම මෙයාලා Fiverr Gig එකට Video එකක් දාන්න කියලා පැහැදිලිව විශේෂයෙන් කියලා තියෙනවා. මොකද, ඇත්තටම Video එකකින් Sales වර්ධනය වෙන නිසා.

මුලින්ම මං Gigs වලට Video දැම්මේ නැහැ, ඒක ටිකක් ලොකු වැඩක් වගේ පෙනුන හින්දා, ඒත් දැන්නම් එක පුංචි වැඩක්.

1. Fiverr Gig Video එකක් හදනකොට ඔයා කැමරාව ඉස්සරහා ඉඳලා ඒක Present කරන්න ඕනම නැහැ. ඒක ටිකක් අවුල් වගේනේ..! ඒත් එහෙම කරන Video එකක් ගොඩක් Personalized වගේම Trust එකකුත් ලැබෙනවා.

2. ඔයාගේ කටහඬින්ම පුන්චි Video Script එකක් හදලා කියන්න බලන්න. Robo Recording දාලානම් වැඩක් නැහැ, Video එක Approve කරන්නේ නැහැ.

3. Gig එක ගැන කියන්න පුලුවන් උපරිම විස්තර සරල විදිහට Video එකේ දාන්න.

4. Fiverr Logo එක, “Exclusively on Fiverr.com” කියන Phrase එක හැම Image එකේම හොඳට පේන තැනකින් දාන්න, නැත්නම් Video එක Deny කරලා එහෙම දාන්න කියලා ඉල්ලනවා.

5. ලස්සන Background Music එකක් හිමීට දාන්න ඔයා Voice Narration කරන අතරේ.

6. Gig Video එක උපරිම තත්පර 45ට විතර හදන්න.

7. Gig Extras එහෙම දෙන්න තියෙනවනම්, ඒවා ගැනත් Video එකේ කියන්න.

මං මගේ ඔක්කොම Internet Marketing වැඩ වලට Videos හදන්න පාවිච්චිකරන්නේ Camtasia Software එක. මේකෙන් ඉක්මනින් Professional Videos හදාගන්න පුලුවන්.

ACTION POINT: ඔයාට හදන්න පුලුවන් උපරිම විදිහට ලස්සනට Fiverr Gig Video එකත් හදන්න හැම Gig එකකටම.

# Fiverr Gig Description Creation Technique

Fiverr Gig Description එක තමයි වැදගත්ම දේ මොකද ගොඩක් වෙලාවට Gig Title එක බැලුවට පස්සේ කෙලින්ම බලන්නේ Gig Description එක. ඉතින් මෙතනදි ඔයා හරියට Service එක ගැන කියලා නොතිබුනොත් ඒක ඔයාට Sale එකක් Miss වෙන්න හේතුවක් වෙනවා. කලින් Fiverr Design එකේදී ඔයාගේ Gigs වලට කිසිම විදිහකින් Formatting දාන්න බැරිවුනා, ඒත් අලුත් Fiverr Design එකේ ඔයාට Formatting දාන්න පුලුවන්. ඒ කියන්නේ Gig Description Writing Technique කිහිපයක් තියෙනවා දැන්.

1. අපිට කලින් Fiverr Design එකේදී Paragraph වෙන් කරන්න බැරි නිසා මං Paragraph වෙන් කරේ සමාන ලකුණු(=) පේලියක් එහෙමත් නැත්නම් අඩුකිරිමේ ලකුණු(-) පේළියක් දාලා. පහළින් තියෙන්නේ මං දැනුත් පාවිච්චිකරන Gig Layout එක.

මෙතන ලියන්නේ දෙන Service එකේ වටිනාකම(ගාන නෙමෙයි ).
==============================================================

මෙතන ලියන්නේ දෙන Service එකේ ඔක්කොම Features, Bonuses, ඇතුලත් වන/නොවන දේ ලිස්ට් එකක් විදිහට.
==============================================================

මෙතන ලියන්නේ මගේ Service එක ඇයි ගන්න ඕනා, මගේ Experience, Fiverr Level එක, Complete කරපු Projects ගාන වගේ දේවලුයි, මට වැඩේ පටන්ගන්න Buyerගේන් අවශ්‍ය වෙන දේවල් ගැන.

2. Fiverr v2 Design එකේදී තියෙන මේ Formatting Feature එකත් එක්ක ඔයාට පුලුවන් අකුරු ලොකු කරන්න(Big T), අකුරු පොඩි කරන්න(Small T), Highlight කරන්න(Pen Icon), අකුරු Bold කරන්න(B) වගේම අකුරු Italics කරන්න(I). මේ දීල තියෙන Options පාවිච්චිකරලා ඔයාට පුලුවන් අවශ්‍ය දේවල් හොන්දට Highlight කරන්න.

# Fiverr v2 Description Formatting

Gig Description එක ලියන Layout එක වගේම එකේ ඇතුලත් වෙන්න ඕන දේවල් ලිස්ට් එකක් පහළින් තියෙනවා. මෙතන තියෙන හැම එකක්ම දාන්න ලැබෙන්නේ නැහැ, ඒ නිසා හොඳම ඒවා තෝරගෙන Converting Fiverr Gig Description එක ලියන්න පටන්ගන්න.

- ඔයාට සම්පූර්ණ Fiverr Gig Description එකේ ලියන්න පුලුවන් අකුරු 1200ක් විතරයි.
- ඔයාගේ සේවය මොකක්ද කියන එක.
- ඔයා දෙන සේවය ඇයි අනිත් අය දෙන එකට වඩා වෙනස් එහෙමත් නැත්නම් ඔයාගේ සේවයේ තියෙන Special එක මොකක්ද අනිත් ඒවා එක්ක Compare කරාම.
- ඔයාගේ සේවයේ තියෙන ප්‍රධාන Features ටික.
- ඔයාගේ සේවයේ තියෙන ප්‍රධාන වාසි ටික.
- ඔයා $5ට මොනාද කරන්නේ? තව වැඩි ගණන් වලට මොනාද කරන්නේ?
- ඔයාගේ සේවය ගත්තම මොනාහරි Free Offers තියෙනවද, Discounts තියෙනවද, Bonuses තියෙනවද වගේ දේවල්.
- ඔයා ඇයි මේ සේවය පිරිනමන්න සුදුසු?
- මොන වගේ පිරිසකටද ඔයාගේ සේවය ගැළපෙන්නේ?

ACTION POINT: මේ හැම දෙයක්ම පාවිච්චිකරලා Maximum Optimized Fiverr Gig Description එකක් ලියන්න හැම Gig Idea එකටම.

# Fiverr Gig Tags Selection Technique

Fiverr Gig Tags කියන්නේ ඔයාගේ Gig එක Fiverr Search එකේ හොයද්දී උඩට එන්න උදව් වෙන දෙයක්. හැබැයි මේවා විතරක්ම නෙමෙයි Fiverr Search එකේ Gig එක උඩට එන්න බලපාන්නේ, ඒ දේවල් ගැන පස්සේ කියන්නම්.

ඔයා තෝරගත්තු Service එකට ගැළපෙන ගහන්න පුලුවන් ඔක්කොම Tags ගහන්න. මෙතනදි ගහන්න පුලුවන් ඔක්කොම කිව්වට ඔයාට ගහන්න පුලුවන් වෙන්නේ

5ක් වගේ තමයි. ඒ නිසා හොඳටම ගැළපෙන ඒවා දාන එක තමයි හොඳ. උදාහරණයක් විදිහට Website Design Service ගත්තොත් පාවිච්චිකරන්න පුලුවන් වෙන්නේ Web Design, Web Developing, Site Creation, Web Graphics etc.

මතක තියාගන්න, ඔයා Gig Title එක, Gig Description එක වගේම Tags ලියද්දී එකම වචනය 3පාරට වඩා ලියන්න එපා. මොකද Fiverr System එකෙන් එහෙම ඒවා තියෙන Gigs Save කරන්න දෙන්නේ නැහැ. දැන් මේ ඔක්කොම දේවල් හැදුවට පස්සේ අන්තිමට එන්නේ Fiverr එකේ ඔයාට දාන්න පුලුවන් Maximum Optimized Fiverr Gig එකක්. ඔයාගේ Gig Ideas ඔක්කොටම මේ විදිහට හදාගන්න, ඊට පස්සේ Fiverr එකේ එකපාර මේ ඔක්කොම දාන්න පුලුවන්.

## ඔයාගේ පළවෙනි Fiverr Gig එක නිවැරදිව Publish කරන්න

ඔයා කලින් පාඩම් වල තිබුන විදිහට වැඩ කරානම් දැන් ඔයාට පහළ තියෙන අත්‍යවශ්‍ය දේවල් තියෙන්න ඕනා. ඔයාගේ Fiverr Business එකේ Gigs කීයක් දානවද කියලා අන්තිමට ආපු Gig Ideas වලින් දන්නවා ඇතිනේ.

1. Gig Title.
2. Gig Images(3).
3. Gig Description.
4. Tags.
5. Buyer Instructions.
6. Gig Video.

# Fiverr Gig Creation

දැන් ඒ හදපු දේවල් ටික අරගෙන Fiverr Gig එක හදන්න ලෑස්තිවෙන්න. මුලින්ම Fiverr.com ගිහින් Username & Password ගහලා Login වෙන්න. ඊට පස්සේ උඩම කොනේ 'Sales' කියන එක Click කරලා දකුණු පැත්තේ Sidebar එකේ කොළ පාටින් Highlight කරලා තියෙන 'Create Gig' කියන එක Click කරන්න. එතකොට Fiverr Gig Creation Page එක Open වෙයි.දැන් තියෙන්නේ කලින් ලියලා තියාගත්තු Title, Description ටික Paste කරගෙන යන්න තමයි.

## Fiverr Gig Creation Title & Category

Fiverr Gig Title එක නිතරම වගේ 'Just Perfect' කියන Green Message එකේ තියාගන්න බලන්න, මොකද Fiverr System එක ඒකට කැමතියි.

ඊටපස්සේ ඔයා Gig එකෙන් දෙන්න ඉන්න Service එකට හොඳටම ගැළපෙන Category එකයි, Sub-Category එකයි තෝරන්න.

## Fiverr Gig Creation Images

ඔයාට මං කිව්ව විදිහට ඒ Tips පිළිපැදලා ලස්සන Gig Images 3ක් මේ වෙනකොට ඇති කියලා හිතනවා. ඔයාටම මේ Gig Images 3 අලුතෙන්ම හදන්න කිව්වේ එතකොට Copyright Ownership එක තියෙන්නේ ඔයාට නිසා. පේනවනේ Gig Images Select කරන්න තියන තැනම ආයෙත් Reminder එකක් දාලා තියෙනවා. ඔයා හිතනවට වඩා Copyright, Intellectual Property Rights කියන දේවල් බරපතලයි.

## Fiverr Gig Creation Description

ඔන්න දැන් තමයි වැදගත්ම තැනකට ඇවිල්ලා තියෙන්නේ. ඔයාට කලින් ලිපියේ මං Gig Description එක ලියන්න Layout එකක් දුන්නා, ඔය පින්තූරයේ තියෙන්නේ අලුත් Layout එක කැමතිනම් ඒ විදිහට Gig Description එක වෙනස් කරගන්න මොකද මේක කලින් එකට වඩා ආකර්ශණීයයි. Online Marketing වලදී Product or Service Description එකට Sales Pitch කියලා තමයි කියන්නේ. ඒ කියන්නේ ඔයාගේ Gig Description එක තමයි Sales Pitch එක වෙන්නේ.

## Fiverr Gig Creation Tags & Duration

හරි දැන් තියෙන්නේ කලින් ලියලා තියාගත්ත Tags ටික Paste කරන්නයි. මතක තියාගන්න හොඳටම ගැළපෙන Tags 5ක් තෝරගෙන මෙතනට දාන්න, ඒක ඔයාට ලැබෙන OnSite Fiverr Promotion එකට බලපානවා.

ඔයාට වැඩේ ඉවර කරන්න යන කාලයත් එක්ක බලලා තමයි Delivery Date එක දාන්න ඕන. ඉක්මනින් Deliver කරන Gigs වලට වැඩියෙන් Sales එනවා කියලා හිතලා අඩු කාලයක් දාන්න එපා. මොකද Delivery Date එක පයිනවා කියන්නේ Fiverr එකෙන් ඔයාගේ Gigs වලට ලැබෙන Promotion එක හොඳටම අඩුවෙනවා.

## Fiverr Gig Creation Buyer Instructions

අන්තිමටම තියෙන්නේ Buyer Instructions ටික ලියන්න, කලින් ලියාගත්තු Instructions ටික මෙතන ඔය පින්තූරයේ තියන විදිහට ඒවත් එකතු කරලා දාන්න. Gig එකට Payment එකක් කරපු ගමන් එයා ඔයාගේ Customer කෙනෙක් වෙනවා, ඔයා කොයිතරම් Professionalද, කොච්චර හොඳට Communication එක ගැන හිතනවද වගේම හොර බොරු නැති කෙනෙක්ද කියලා අදහසක් දෙන්න හොඳම අවස්ථාව තමයි Buyer Instructions කියන්නේ.

මොකද Gig එක Purchase කරපු ගමන් Customer ඔයාගෙන් දකින එකම වචන ටික Buyer Instructions ටිකයි.

ඔය පින්තූරයේ තියන එක කියෙව්වම Customerට ඔයා ගැන හොඳ පැහැදීමක් ඇතිවෙනවා. ඒ වගේම එයා අහන ඕනම ප්‍රශ්ණයකට හොඳට උත්තර දෙන්න. එයාට පෙන්වන්න ඔයා සේවය දෙන Industry එකේ Expert කෙනෙක් කියලා.

හරි දැන් ඔක්කොම කරලා ඉවරවුනාම ‘Save & Continue’ Click කරන්න ඊට පස්සේ එන්නේ Gig Video එක දාන්න. ඔයා හදපු Gig Video එක Select කරලා ආයෙත් ‘Save & Continue’ Click කරන්න. ඔයාගේ Gig එකෙන් Physical Product එකක් Sell කරන්නේ නැති නිසා Shipping Charges Skip කරන්න. අන්තිමටම තියෙන්නේ Gig එක Publish කරන්න.

# **Fiverr Business එකට ගින්දර Boost එකක් දෙන්න SEO වලට පුලුවන්ද?**

සාර්ථකත්වයේ එක වැදගත් තැනක අත්නොහරින උත්සහය කියලා දෙයක් තියෙනවා, ඉතින් ඒක ඔයා ළඟ තියාගෙන දිගටම උත්සහා කරන්න. ඉතින් කලින් කිව්ව හැමදේම කරලත් ඔයාට තාම ප්රතිපලයක් නැතිනම් ඔයාට ඒ දේවල් කරද්දී කොතනද වැරදුනේ කියලා හොයාගෙන එතනට Optimizzation එකක් දෙන්න.

ඔයාගේ Fiverr Business එක තියෙන තැනින් තව ටිකක් උඩට ගෙනියන්න වැදගත් Strategies ටිකක් දෙන්නම්.

කැමතිද ඔයාගේ Business එකට ගින්දර Boost එකක් දෙන්න? මං ඒක තවත් පැහැදිලි කලොත් SEO(search engine optimization) කියන අකුරු තුනෙන් කියල...?

## Bit of SEO, Load of Exposure

ඔයාගේ Fiverr Gig එක SEO කරන්න මුලින්ම අවශ්ය වෙන්නේ Primary Keyword එක හොයාගන්න එක. මෙහෙම හිතන්නකෝ, ඔයා දෙන සේවය මිලදීගන්න ඕන අය මොනවගේ වචනයක් (හෝ දෙකක්) පාවිච්චි කරයිද ඔයාගේ සේවය ගැන හොයන්න.

Example:
ඔයාට Conversion Rate Optimization ගැන Gig එකක් තියෙනවනම් Primary Keyword එක විදිහට, Conversion Optimization කියන එක ගන්න පුලුවන්.

මේ විදිහට ඔයාගේ Gigs වලටත් Primary keywords තෝරගන්න.

Title, Description, Tags with SEO

Gig Title එක ලියද්දී ඔයා තෝරගත්ත Primary Keyword එකත් ඒකට ඇතුලත් කරන්න ඕනා. ඒ වගේම ඔයාගේ Gig එක Publish(Save) කරපු ගමන් ඒකට Gig URL එකකුත් හැදෙනවා හැබැයි ඔයාට පස්සේ ඒ URL එක වෙනස්කරන්න බැහැ.

මේ Gig URL එක හැදෙන්නේ ඔයාගේ Gig Title එකේ වචන වලින්. පහළ උදාහරණය බලන්නකෝ
Gig Title – I will create highly professional graphic design for $5

Gig URL – http://fiverr.com/leanlifeacademy/create-a-highly-professional-graphic-design
Title in the URL – create-a-highly-professional-graphic-design

කොහොමහරි Gig Title එකෙයි, Gig URL එකෙයි Primary Keyword එක දාගන්න බලන්න.

Gig Description එකේදී මේ Primary Keyword එක උපරිම 2-3 අතර දාන්න ඕනා. සාමාන්‍යයෙන් අකුරු 1200න් ලියන්න පුලුවන් වචන 240ක් වගේ. ඉතින් මේ වචන ගාණට Primary Keyword එක 2-3ක් සඳහන් කරන එක අවුලක් නෑ. මෙතනදි තවත් දෙයක් ගැන සැළකිලිමත් වෙන්න ඕනා ඒ තමයි ඔයා මේ ලියන Description එකේ පළවෙනි වාක්‍ය තමයි Search Result එකේ පෙන්වන්නේ.

ඒ නිසා Primary Keyword එකෙන් පළවෙනි වාක්‍ය පටන්ගන්න පුලුවන් නම් නියමයි. Gig Tags වලටත් පළවෙනි Tag එක හෝ දෙක විදිහට Primary Keyword එක දාන්න.

Gig Images SEO

Gig Image එකක් SEO කරන්න ක්‍රම 2ක් තියෙනවා, ඒ Image File Name එක වගේම Image Meta Data ටිකයි. මතක ඇතුව ඔයාගේ Primary Keyword එක Gig Images 3නේ File Name එකට දාන්න. ඒක නම් ලේසියි! Image Meta Data දාන්න Photoshop Software එක පාවිච්චි කරන්න පුලුවන්.

තවත් දෙයක් තමයි Image එකේ File Size එක. මේක පුලුවන් උපරිමයෙන් අඩුකරන්න ඒවගේම Photoshop වලින්ම මේ වැඩෙත් කරගන්න පුලුවන් කිසිම අවුලක් නැතුව.

## Gig Video SEO

Gig Video එකක් SEO කරන්නත් කලින් කිව්ව ක්‍රම 2ම තමයි පාවිච්චි කරන්නේ ඒ කියන්නේ ඔයාගේ Primary Keyword එකත් Video File Name එකට දාන්න. Video Meta Data දාන්න මං පාවිච්චි කරන්නේ Camtasia Software එක, ඒකෙන් තමයි මගේ හැම Video වැඩක්ම දැනට කරන්නේ.

කලින් Images වලට කලා වගේ Video එකේ Size එකත් අඩුකරන්න, එතකොට SEO වලට වගේම Gig එක බලන කෙනාටත් කරදරයක් නැහැ මොකද Video එක

ඉක්මනට Load වෙනවා. ගොඩක් වෙලාවට Camtasia වලින් හදන 45s Videos වල Size එක 20mb පයින්නේ නැහැ.

## Possible Category SEO

හිතන්නකෝ ඔයාගේ Gig එකෙන් ලබාදෙන්නේ Copywriting Service එකක් කියලා ඉතින් මෙතනදි ඔයාගේ Primary Keyword එක 'Copywriting' කියලා ගන්න පුලුවන්. එතකොට ඔයාට Categories විදිහට ගන්න පුලුවන් මේ දෙක.

Main Category – Writing & Translation.
Sub Category – Copywriting.

මේ වගේ ඔයා තෝරගන්න Primary Keyword එක Category එහෙකත් තියෙනවා නම් ඒක Category එක විදිහට තෝරගන්න.

## All Positive Reviews

ඔයා Gig එකකින් ලබාදෙන සේවය මිලදීගන්න කෙනෙක් Google එකේ Search කරනකොට වාසනාවකට වගේ ඔයාගේ Gig එක පේන්න පුලුවන් මෙතනදි ඒ කෙනාට ඔයාගේ Service එකට ලැබිලා තියෙන Rating එක පේනවා. ඉතින් ඔයාගේ ඔක්කොම Customersලා Gig එකට Positive Rate කරලා තිබුනම ඒ කෙනාට පේන්නේ තරු 5හේ සේවයක් විදිහට.

## Social Signals for Fiverr Gig SEO

මේ ගැනනම් සමහර අයට හඳුන්වලා දෙන්න දෙයක් නැහැ, මොකද ගොඩක් අය Gig එක විදිහට කරන්නෙත් Social Signals විකුණන එකනේ. Social Media Sites කියන්නේ ලෝකයේ ලොකු විශ්වාසයක් තියෙන වගේම මිනිස්සු ගොඩක් ගැවසෙන තැනක්.

ඉතින් මේ වගේ තැනක ඔයාගේ Services ගැන කතාබහක් වෙනවා කියන්නේ ඒක හොඳ දෙයක් වගේම මේ වගේ තැන්වල ඔයාගේ Fiverr Gigs වලට Links තියනවා කියන්නේ Googleට ටිකක් වැදගත් දෙයක්. හැබැයි ගොඩක් අය කරන විදිහට මේකෙන් ගන්න පුලුවන් උපරිම දේවල් ගන්න බැහැ.

ඔයාට නිකං ආතල් එකට වගේ හිතුනනම් මොනාහරි Social Signal Exchange Site එකකට Join වෙලා අම්බානෙට මේවා ටිකක් ගන්න, ඒක හිතින් අයින්කරගන්න එක හොඳයි.

ඒ විදිහට ගන්නකොට ඒක Natural දෙයක් නෙමෙයි, Natural නැති දෙයකට Google කැමති නැහැ. ඒ නිසා සාමාන්‍ය ක්‍රමේකින් මේ දේවල් ගන්න එක තමා හොඳ.

හෙමිහිට ඔයාගේ Social Profiles වලින් එක ගාණේ අරගෙන ඔයාගේ යාලුවොන්ගෙත් උදව් අරගන්න. මං නිතරම Target කරන්නේ Social Media Sites 5කට විතරයි.

1. Google+
2. Youtube
3. Facebook
4. Twitter
5. Pinterest

මෙතනින් Google+ වලට සුවිශේෂී තැනක් තියෙනවා ඒ කොහොමවුනත් මේ 5න් ඔයාට පුලුවන් තරම් Shares අරගන්න බලන්න හිමිහිට වගේම ටිකෙන් ටික.

# Effective Fiverr Promotion එකක් ගන්න Simple Tips 10ක්

Fiverr කියන්නේ Online Marketplace එකක් මේ වගේ Marketplace එකක සේවා සපයන පිරිසට කියන්නේ Freelancersලා කියලා. ඉතින් මේ වගේ Marketplace එකකින් ලබන්න පුලුවන් පට්ටම දේ මුදල් නම් නෙමෙයි, ඒ වටිනම දේ එක වචනයකින් කිව්වොත් – Marketing.

ඔයාට හරියට Marketing or Promotion පැත්ත බලාගන්න බැරිනම් එතන මුදල් හොයන්න පුලුවන් හැකියාවක් නෑ.




ගොඩක් Fiverr කරන අය Promotion ගැන හිතන්නේ වත් නෑ, ඉතින් මෙහෙම නොහිතා ඉන්න කට්ටියගෙන් බාගයකටවත් Fiverr Orders එන්නේ නෑ. Marketing ගැන හිතන්නේ නැති ගොඩට දැනට Fiverr වල හොඳ Income එකක් හොයන අයවත් අයත් වෙන්න පුලුවන්. කොහොමවුනත් මේ ගැන හිතන්නේ නැතුව ඉඳලත් සාර්ථකයි කියලා කියන්න පුලුවන් අයට එහෙම වටිනා අවස්ථාවක් ලැබිලා තියෙන්නේ Fiverr වලින් කරන Targeted Promotion එක නිසයි.

මේ Fiverr වලින් නොමිලේම කරන Promotion එක ලබන්න ඔයාට සුදුසුකම් ටිකක් තියෙන්න ඕනා. කිසිම දෙයක් නිකං ලැබෙන්නේ නෑ, හැමදාම Gig එක දාලා නිකං බලාගෙන හිටියොත් සාර්ථක වෙන්න බැහැ. Fiverr කියන්නේ ලොකු Marketplace එකක්, එයාලට බැහැ එයාලගේ Business එකට හානියක් කරගන්න. කෙටියෙන්, Fiverr විසින් මෙහෙම නොමිලේ Promote කරන්නේ කැපවීමක් තියෙන දක්ෂ Fiverr Sellersලව විතරයි.

ඔයාට එන Customer කෙනෙකුට හොඳ තෘප්තිමත් වෙන්න පුලුවන් Service එකක් දෙන්න ඔයාට හැකියාවක් නැත්නම්, එහෙම කෙනෙකුට Promotion එක ලැබිලා තේරුමක් නැහැ වගේම ඒක Fiverr එකට ලොකු Risk එකක්.

මොකද ඒ එන Customer ඔයාගේ වෙන්න කලින් තමයි Fiverr Marketplace එකේ Customer කෙනෙක් වුනේ. වෙනත් විදිහකින් කිව්වොත් ඇතුලෙදි ඔයාගෙන් මොනවහරි Service එකක් ලබන කිසිම කෙනෙක් ඔයාගේ Customer කෙනෙක් නෙමෙයි, ඒ අය Fiverr Marketplace එකේ Customersලා. ඉතින් ඔයාට Fiverr එක එහෙම Promotion එකකින් අරගෙන දෙන කෙනාට උපරිම සේවයක් දෙන්න බැරිනම් එතනදි ඒක Fiverr එකට ලොකු අවුලක් වෙනවා. ඉතින් එන හැම කෙනාටම හොඳ Service එකක් දෙන එක තමයි Fiverr ඔයාගෙන් බලාපොරොත්තු වෙන්නේ.

ඔයා Professional Fiverr Seller කෙනෙක් කියලා Fiverr System එකට පෙන්වන්න ක්‍රම 10ක් දැන් කියන්නම්. එතකොට ඔයා දැන් ඉන්න Income Level එකට වඩා ඉහළ Income Level එකකට යන්න පුලුවන්.

**1. Check your Fiverr Account Every Second.**

ඔයා එක මාසයකට හරි Day Job එකක් කරපු කෙනෙක් නම් ඔයා දන්නවා ඇති එක දවසක් හරි වැඩට නොගියොත් මොන වගේ තත්වයක්ද ඇතිවෙන්නේ කියලා. එහෙමත් නැත්නම් හිතමුකෝ බොහොම සාමාන්‍ය ව්‍යාපාරයක් වන Shop එකක් ඔයා කරනවා කියලා, එක දවසක් Shop එක Open කරේ නැතිවුනොත් කොච්චර ආතල් එකක් ලැබෙනවද ඒකෙන්?

සමහරවිට ඔයාට දැනටමත් Point එක අවබෝධ වුනා. සරලව, හැමදාම Fiverr Account එකට Log වෙන්න පැයක් දෙකක් ඉඳලා Log Out කරන්න එපා, Computer එක On කරලා තියන හැම වෙලාවෙම Fiverr එකේ Log වෙලා ඉන්න. ඒකෙන් ඔයා Active Seller කෙනෙක් කියලා ඔප්පු වෙනවා.

**2. Reply Every Message Faster Than Lightening**

Online Business එකක Key-Factor එකක් තමයි Perfect Communication. ඉතින් මේක හරියට නැත්නම් Fiverr Seller කෙනෙක් විදිහට වැඩ කරන එක අමාරුයි. ගොඩක් අයට English කියන්නේ ටිකක් ලොකු ප්‍රශ්ණයක්නේ, ඒක ප්‍රශ්ණයක් කරගන්න එපා ඔයාගේ English Knowledge එක දියුණු කරගන්න. Internet තිබුනත් වැඩක් නෑ හොඳ English Knowledge එකක් නැත්නම් මොකද English කියන්නේ හැමදේටම වගේ Vital Factor එකක්.

සමහර අය නිතරම කියන්නේ English දන්නේ නෑ කියලා, ඒත ඔයා කරන්න ඕන දන්නේ නෑ කියන එක නෙමෙයි, ඒකට Action එකක් අරගෙන ඉගෙනගන්න එකයි.

ඔයාගේ English Perfect වෙන්න ඕන නැහැ Perfect Communication එකක් කරන්න. ඒ කිව්වේ ඔයාට දියුණු කරගන්න අත්‍යවශ්‍යම දේවල් වෙන්නේ Writing, Understanding.

ඔයාගේ Fiverr Account එකට එන හැම Message එකකටම ඉක්මනට Reply කරන්න. මොනාහරි දේකට බලාගෙන ඉන්න එක ටිකක් අමාරු වැඩක්, ඉතින් ඉක්මනින් Reply කරද්දී ඒක අමාරු දෙයක් නෙමෙයි. පුලුවන් තරම් ඔයා Reply කරනකොට Polite වෙන්න, මෙතනදි Polite කියන්නේ බැගෑපත් වෙන එක නෙමෙයි, Professional විදිහට Potential Customerට Respect කරලා Reply කරන එකයි. ඉක්මන් Reply එකක් කියන්නේ Customerට Quick Boost එකක් වගේ දෙයක්.

පුලුවන් තරම් වැඩේ ගැන විස්තර කරන්න, Message එක ලියන්න කම්මැලි වෙන්න එපා. Potential Customerට ඕනම ප්‍රශ්ණයක් අහන්න කියන්න. එයාට ඔයා ගැන Trust එකක් ඇතිකරවන්න මේ දේවල් ප්‍රමාණවත්. ඒ වගේම මේකත් ගොඩක් වැදගත් දෙයක්. Order එකක් ගන්න කලින් තියෙන කැපවීම, ඉක්මන් Reply කිරීම වගේ දේවල් Order එක ගත්තට පස්සෙත් ඒ විදිහටම තියාගන්න. නැත්නම් Order එක Deliver කරන්න කලින් ඒක Cancel වෙයි. ඔයාගේ Gig එක Customer ගත්තට පස්සේ එයාට ඒ වෙනුවෙන් Thank කරන්න.

**3. Surf the Fiverr, Receive the Fiverr Promotion.**

මේක ඒ තරම් ලොකු Impact එකක් නැහැ, ඒත් මේකෙනුත් ඔයා Active කෙනෙක් කියලා පේනවා. ඒ වගේම ඔයාට පුලුවන් අනිත් Sellersලා මොනවද කරන්නේ එයාලා Use කරන Strategies මොනවද එහෙම කියලා බලාගන්න. Fiverr Blog එක එහෙම නිතරම කියවලා Comment එකක් එහෙම දාන්න. Fiverr Forum එක කියන්නේ Fiverr Community එකේ Highlight වෙන්න පුලුවන් නියම තැනක්. ඒත් මෙතනින් ලොකුවට Orders එයිද කියලා නම් ලොකු Sure එකක් නැහැ. ඔයා Top Rated Seller වෙන්න සුදුසු නම් මෙතන පොඩ්ඩක් Highlight වුනොත් Top Rated Seller වෙන්නත් Chance එකක් තියනවා.

**4. 20 Eggs is Better Than Just 1.**

කලින් කියලා දුන්න විදිහට හොඳ Gig Ideas ටිකක් හදාගෙන ඒකෙන් එක Gig එකක් විතරක් දාන්න එපා. එතකොට ලැබෙන Promotion එක ලැබෙන්නේ එක Gig එකකටයි, නමුත් ඔයා 20ක් දැම්මොත් එහෙම ලැබෙන Promotion එක 20ටම ලැබෙනවා. දැන් මොකද කියන්නේ 1ක බිත්තරේද හොඳ, බිත්තර 20ක් දාන එකද හොඳ...?

කවුරුත් Order එකක් ගන්න කැමතියි, ඒවගේම ඒ Order එක 10, 20 හෝ 30ක් කරගන්නත් කැමතියි, ඒත් එහෙම එන්න ගත්තොත් ඔයාට කරගන්න පුලුවන් වෙයිද? එතනයි මට ප්‍රශ්ණය ආවේ. ඉතින් එහෙම ඔයාට එන ඒවා කරගන්න අමාරු වගේ නම් එකම Gig එක වෙනස් විදිහට දාන්න. මෙතනදි පොඩ්ඩක් Tricky වෙන්න වෙනවා මොකද Fiverr CS එකෙන් නැත්නම් Gig එක Deny කරනවා.

ඔයාගේ Gig එකෙන් ලබාගන්න පුලුවන් එක Benefit එකක් නෙමෙයිනේ, නේද? අන්න ඒ Benefit එක එක Gig Title එක කරලා Gig එක හදන්න. ඒ වගේම Description, Title, Videos and Images වගේ හැමදෙයක්ම අලුතෙන්ම ආයේ ලියන්න හදන්න වෙනවා.

### 5. Kill It With To Do List.

To Do Page එකේ තියෙන්නේ ඔයා විසින් අනිවාර්යයෙන් කළයුතු කාර්යයන්. ඉතින් මේවා එකක් හරි ඔයා නොකළොත් ඒකේ පාඩුවත් ඔයාටම තමයි. මේ දේවල් ඔයා නොකරද්දි ඒක Fiverr System එකට පේන්නේ ඔයා කිසි වගකීමක් වගේම කැපවීමක් නැති Seller කෙනෙක් කියලා. එහෙම කෙනෙකුට අනිවා Customer කෙනෙක්ව තෘප්තිමත් කරන්න අරමුණක් නැහැනේ.

ඒ නිසා මෙතන පෙන්වන කාර්යයන් ටික කරන්න ඉක්මනින්. ඔයාට බඩගිනි හැදුනම බිස්කට් පැකට් එකක් ඉවර වෙනවා වගේ මේවා එතනට එද්දිම කරලා ඉවර කරන්න.

මෙතන ඉතින් කරන්න කියලා එන්නේ මේ දේවල් තමයි.
1. ඔයාගේ Gig එකක් ගත්තු Customer කෙනෙක්ට Rate කරන්න.
2. ඔයාට ආපු Order එකක් Deliver කරන්න.
3. ඔයාට එන Messages වලට Reply කරන්න.

### 6. Capture the Buyer Requests.

මේක තාමත් වටින දෙයක් වගේම හැමදාම කළයුතු දෙයක්. නිකමට හැමදාම කරලා බලන්න ඔයාටම තේරුම් යයි Sales එන ගතිය ටිකක් වැඩියි කියලා. මේ කිව්වේ Buyer Requests වලින් යවන කට්ටිය ගන්නවා කියලා නෙමෙයි. ඒ Fiverr එකෙන් කරන Promotion වලින් ලැබෙන Sales තමයි.

ඔයා No Fiverr Level නම් ඔයාට Offer 1ක් යවන්න පුලුවන්. Level 1 නම් 3ක් යවන්න පුලුවන්. Level 2 නම් 5ක් යවන්න පුලුවන්. Top Rated Seller නම් 10ක් යවන්න පුලුවන්. ඒ නිසා යවන්න පුලුවන් උපරිම ගාණ යවන්න Improvement එකක් ඔයාටම පෙනෙයි.

## 7. Be a Positive Review Lover.

Positive Review එකකට සරලව අවශ්‍ය වෙන්නේ Customerව උපරිම විදිහට තෘප්තිමත් කරන එකයි! මේ දේවල් ගැන ටිකක් හිතන්නකෝ අනිවා ඔයාට Positive Review ගන්න එක ඒතරම් ගේමක් වෙන්නේ නෑ.

1. නිතරම Polite විදිහට Customerට Message කරන්න.
2. Customerට අවශ්‍ය මොකක්ද කියලා තිතටම දැනගන්න, එයාට ඕන දෙයක් අහන්න කියන්න.
3. Customerට අවශ්‍ය දේ ඒ විදිහටම Deliver කරන්න.
4. වැරැද්දක් තියෙනවනම් ඒක හදලා දෙන්න.
5. Deliver කරනකොට Customerට වැදගත් වෙන ලොකු Bonus Package එකක් යවන්න.

මේ ඔක්කොමත් කරලා Customerට වැඩේ Satisfy නැත්නම් කෙලින්ම Order එක Reject කරලා Customerට Mutual Cancellation එකක් එවන්න කියන්න. මේ අවස්ථාවේදී ඔයා ගොඩක් ඉවසීමෙන් තමයි Message කරන්න ඕනා මොකද ඔයාට තදවුනා කියලා මුකුත් කරන්න බැහැ. කොහොමහරි Customer ඉන්නේ කතාකරලා අර විදිහට Mutual Cancellation එකක් එවන්න පුලුවන් තත්වෙක නෙමෙයි නම් කෙලින්ම Fiverr Customer Support එකට කතාකරලා කියන්න ඔයා පුලුවන් හැමදේම කරා ඒත් Customer Satisfy නැති නිසා Order Refund කරන්න ඕන කියලා.

මෙතනදි ඔයාට සල්ලි නැතිවුනත් Reputation එක නැතිවුනේ නැහැ. සල්ලි වලට වඩා වැදගත් වෙන්නේ ඒ දේවල් තමයි!

## 8. Never Cancel an Order.

ඔයාට Fiverr Order එකක් Cancel කරන්න පුලුවන් ක්‍රම 4ක් තියෙනවා, හැබැයි ඒ එක ක්‍රමේකින් වත් Cancel කරන එක අනුමත කරන්න බැහැ. මොකද එන Customer කෙනෙකුව Satisfy කරන්න බැරි එක ගොඩක් වෙලාවට Sellerගේ වැරැද්දක්. ඔව්, Customerගේ වැරදිත් තියෙනවා ඒත් Seller Smart නම් වැරදි තියන කෙනෙක්ව උනත් Satisfy කරන්න පුලුවන්.

ඒත් එහෙම කියලා එන හැම Customerවම Satisfy කරන්න බැහැ, ඒ වගේ අවස්තාවල ඔයාට Cancel කරන්නම වෙනවා.

ඒ නිසා හොඳ කෙනෙක් නම් කොහොමහරි උත්සහා කරලා ඒයාව Satisfy කරන්න බලන්න. බැරිම නම් විතරක් Cancel කරන්න. පහළ තියෙන්නේ Cancel කරන්න තියෙන ක්රම 4.

1. ඔයා විසින් Force Cancel කිරීම – මේක බරපතල වැඩියි.
2. Customer විසින් Force Cancel කිරීම – හොන්ඩටම බරපතලයි.
3. ඔයා විසින් Mutual Cancellation කිරීම – මේකත් අවුල්.
4. Customer විසින් Mutual Cancellation කිරීම – ඒ තරම් අවුලක් නැහැ.

## 9. Create a Killer Fiverr Gig.

ඔයාට මං නියම පාඩමක් එකක් දුන්නනේ කොහොමද Killer Fiverr gig එකක් හදන්නේ කියලා ඉතින් ඒකේ විදිහට Gig එක හදනවනම් මේ Strategy එක කොහොමත් ඔයා කරලා ඉවරයි. මෙතනදි Gig Images හා Gig Video එක ගැන හොඳට හිතන්න.

## 10. Don’t Pass The Red Mark

ඔයා Gig එක හදනකොට හොඳට හිතලා බලලනේ Duration or Deliver Date එක දාන්නේ. ඉතින් එන Order එකක ඔයා මේ Guarantee වුන Delivery Date එක පයින එක ඒ තරම් හොඳ ලක්ෂණයක් නෙමෙයි. නිතරම වෙලාවට වැඩකරන්න වගේම වෙලාවට Deliver කරන්න පුරුදුවෙන්න. ඔයා එක Order එකක් හරි Late වුනොත් ආයේ සමාවක් නැහැ ඒ වගේම ඔයාටම තේරේවී Orders එන එක හොඳටම අඩු වෙනවා කියලා.

Delivery Date එකට කලින් Deliver කරන හැමෝටම වගේ හොඳ Income එකකට ලේසියෙන්ම යන්න පුලුවන් OffSite Fiverr Promotion කරන්නෙම නැතුව. හැබැයි ඊටත් වඩා පට්ට තැනකට යන්න පුලුවන් OffSite Fiverr Promotion කලොත්.

# Perfect Communication For Fiverr Success

Perfect Communication එකක් කියන්නේ Online Business එකකට වගේම හැම දේකටම අතිශය වැදගත් දෙයක්. ඒත් අවාසනාවට ඇත්ත කතාවක් වගේ ගොඩක් අයට Perfect Communication එකක් නැහැ. ඉතින් ඔයත් එහෙම කෙනෙක් වෙන්න පුලුවන්. එහෙනම් මේ පාඩමෙන් පස්සේ ඔයාට නියම Communication එකක් කරන්නේ කොහොමද කියලා පැහැදිළි අදහසක් එයි.

මෙතනදි Online Business කරන අයට වැඩිපුර වැදගත් වෙන්නේ Telephone Communication එක නෙමෙයි, Written Communication එකයි. ඒ වගේම Offline Business කරන කෙනෙක්ට වුනත් Telephone Communication එකට වඩා පුලුවන් තරම් පාවිච්චිකරන්න ඕනා Written Communication එකයි.

මොකද, Phone එකෙන් කතාකරන වචන ටික නිකන්ම වචන ටිකක් වෙන්නත් පුලුවන්. හිතන්න, ඔයයි Potential Customerයි Phone එකකින් Project එකක් ගැන කතාකරලා Agree වෙනවා දෙන්නම. ඒත් පස්සේ දවසක Customerට Agree වුන Project එකේ එක දෙයක් අමතක වෙනවා, ඉතින් එයා කියනවා ඔයාට, මේ දේටත් අපි Agree වුනා කියලා. (නමුත් එදා Telephone Conversation එකේදී ඔයා ඇත්තටම ඒ දේට Agree වෙන්නේ නැහැ.)

දැන් ඔයාට එහෙම නැහැයි කියන්න Proof එකක් තියනවද?

මගේ Favoriteම Communication Method එක තමයි Written Communication එක. මොකද, කලින් කිව්ව හේතුවත් එක්ක, ඔයාට හොඳට හිතලා බලල Email එක ලියන්න වෙලාව තියනවා.

Fiverr Business එකේදිත් ඔයාට වැදගත් වෙන්නේ Written Communication එකම තමයි. එහෙමනම්, Perfect Communication කියලා මම මෙතනදි අදහස් කරන්නේ Potential Customer කෙනෙක් හෝ Customer කෙනෙක්ව නියම විදිහට Satisfy වෙන්න Communicate කරන එකයි. මේක කරන්න Factors කිහිපයක් බලපානවා, ඒව තව චුට්ටකින් කියන්නම්.

ඔයා සමහරවිට දැන් හිතනවා ඇති, දිග Reply එකක් ලියන්නේ මොකටද $5 Sale එකක් ගන්න කියලා. එහෙනම්, මං මේ ප්රශ්ණය ඔයාට දෙන්නම් ...

Perfect Reply එකක ලියන්න ඕන මෙන්න මේ දේවල්.

මම මොනාද Project එක සම්බන්ධ Industry එකේ දන්නේ. ඒ කිව්වෙ Project එක කරන්න මගේ තියන Knowledge එක, Experience එක ගැන.

දැනට එයාගේ Project එකේ කරල තියන දේවල් වල අඩුපාඩු. කොහොමද ඒ අඩු පාඩු හදාගන්නේ මාත් එක්ක.

එයාගේ Objective එක එහෙමත් නැත්නම් Goal එකට යන්න මගේ Approach එක. ඒ කිව්වේ මං එයාගේ Goal එකට යන්න ගැහුව Plan එක.

අන්තිමට එයාට Action එකක් ගන්න, එයාට තියන ප්රශ්ණ අහන්න වගේම Plan එකට කැමතිද කියලත් ඇහුවා.

ඉතින් මේ ඔක්කොම දේවල් ලිව්වම Potential Customerට පිස්සු හැදෙනවා, “මෙයා Professional Seller කෙනෙක් වගේම මට ඕන වැඩේ කරන්නේ කොහොමද කියලත් Plan කරලා.” ඉතින් මෙයාට මං ගැන ලොකු Trust එකක් ඇතිවෙනවා – Finally a Sale!

මං කරන්නේ Graphic Designing නම් නෙමෙයි, මං කරන්නේ Internet Marketing & Web Engineering කියලා කියන්නම්. ඉතින් හිතාගන්න පුලුවන්නේ $1 ඉඳලා කොච්චර ලොකු Prizes වලට Projects ඇතිවෙන්න පුලුවන් Industries 2ක්ද කියලා.

Graphic Designersලටත් ලොකු Projects ගන්න පුලුවන්, ඒත් Fiverr එකේ ලොකු Projects ගන්නවා කියන්නේ ටිකක් පාඩුයි. ගොඩක් වෙලාවට Fiverr එකේ Buyersලා Project එකේ Market Prize එකට Buy කරන්න කැමති නැහැ. ඔය මං $170ට ගත්තු Project එකට Market Prize එක $250+ වගේ වෙනවා. මෙන්න මේ හේතුව නිසාම තමයි කිසිම Marketplace එකක එල්ලිල Work කරන්න හොඳ නැහැයි කියලා මම කියන්නේ.

Designer විදිහට ඔයාට පුලුවන් Web Design PSD හදන්න. ඒ කිව්වෙ Website එකකට Unique Design එකක් PSD විදිහට හදලා දෙන එක. මේ වගේ Web Design PSD එකකට හොඳ Market Prize එකක් තියෙනවා. ඒ නිසා $170 Project එක වගේ ඔයාටත් ලොකු Projects ගන්න පුලුවන්.

# #5 Tips For Perfectness

මෙන්න මේ දේවල් ටික ඔයාගේ ඊළඟ Fiverr Message එකේ ඉඳලා පාවිච්චිකරලා බලන්න වෙනස කොහොමද කියලා. මෙතනින් සමහර ඒවා ඔයාට එක පාරට කරන්න බැරිවෙයි, ඒත් කරන තරමට Experience එනවා කියන එකත් මතක තියාගන්න!

❶ Perfect English

English කියන්නේ හැමදේටම Vital Factor එකක් කියලා මං මීට කලින් Post එකකදිත් කිව්වා. Perfect Communication එකක් කරන්න නම් ඔයාට හොඳ English Skill එකක් තියෙන්න ඕනා. Fiverr වල වැඩකරන්න ඔයාට අවශ්‍යවෙන්නේ Writing & Understanding විතරයි.

ඉතින් මේ දෙකේ ඔයාට තියෙන Skills දියුණුකරගන්න එක ඔයාට ගොඩක් වැදගත් වෙනවා. සමහර අය ලියන Message වලින් තේරුමක් හිතාගන්න බැහැ. හිතන්න එහෙම තේරුම්ගන්න බැරුව ඉන්නේ ඔයාගේ Potential Customer කෙනෙක් කියලා.

එහෙමනම් එයා ඔයාගේ Gig එක ගනියිද?

නිතරම Confuzed මනසක ඉන්නකොට ඒ කෙනා 'Purchase' කියන තීරණය ගන්නවා ගොඩක් අඩුයි. ඇයි ඉතින් ඔයාගේ English Skills දියුණුකරගෙන Good English වලින් Message එකක් ලියන්නේ නැත්තේ?

දන්නවද, Fiverr වලට එන්නේ English දන්න මිනිස්සුම නෙමෙයි. වෙනත් රටවල මිනිස්සුත් එනවා. ඉතින් මෙයාල අතිනුත් මේ වැරැද්ද වෙන්න පුලුවන්. එහෙම කෙනෙක්ව Set වුනොත් හිමිහිට මඟ ඇරලා දාන එක හොඳයි.

ඔයාගේ English Knowledge එක දියුණුකරගන්න මේ වගේ දේවල් කරන්න.

නිතරම English සිංදු අහන්න, කියන වචන අල්ලගන්න බලන්න.

නිතරම English Movies බලන්න. ලස්සන වචන වගේම නියම Phrases අල්ලගන්න පුලුවන්.

නිතරම සනකම English Blogs කියවන්න. English Language ගැන ලියවුන ඒවම නෙමේ, Internet Marketing ගැන බර වචන දාල ලියන Blog එකක් වුනත් අවුලක් නෑ.

## ❷ Polite Writing

පිටරට මිනිස්සු Polite Communication කියන දේ ගොඩක් අගයනවා. ඉතින් ඔයා Fiverr එකේදී ලියන හැම Message එකක්ම Reply එකක්ම උපරිම Polite විදිහට ලියන එකෙන් එයාලටSatisfaction එකක් දෙන්න පුලුවන්. නිතරම Message එක පටන්ගන්නකොට,

Hello [Name] or [Username],

වගේ Use කරන්න. මෙතනදි Username එක දිහා බැලුවම ඒක එයාගේ නමද, Business Name එකද කියලා බලාගන්න පුලුවන් ගොඩක් වෙලාවට. කෙනෙකුට එයාගේ නමින් කතාකරනකොට Email එකක් ලියනකොට ඒක එයාට නිකන් Personal වගේ හැඟෙනවා. ඒ නිසා නිතරම Message එක යවන්න කලින් එයාගේ Fiverr Profile එකට ගිහින් බලන්න එයාගේ නම Profile Description එකේවත් තියනවද කියලා.

තවත් දෙයක් තමයි, Message එකේ අන්තිමට මේ වගේ දෙයක් ලියන එක.

Let me know if you’re interested in working with me. Also if you have any questions regarding the project, Please let me know.

Thank you,
[Your Name]
[Your Position]

නිතරම කෙනෙකුට Purchase කරන්න ගියාම මොනාමහරි ප්රශ්ණයක් එනවා. ඒකයි ඕනම Online Product or Service එකක FAQs එකක් තියෙන්නේ. උඩ Message එකෙත් කරන්නේ ඒ වගේ දෙයක්. $5ට මොකටද මෙච්චර දහලන්නේ කියලා කිය කිය

ඉන්නේ නැතුව අහන ඕනම ප්රශ්ණයකට අවංකව උත්තර Reply කරන එක හොඳ Seller කෙනෙකුගේ ලක්ෂණයක්.

ඒ වගේම නිතරම Would, Could, Please, Kindly, Willing වගේ වචන Use කරන්න.

## ❸ Professional Voice

වචනවලින් ගොඩක් දේවල් කරන්න පුලුවන්. මනුස්සයෙක්ව නැගිට්ටන්නත් වචන වලට පුලුවන්, වට්ටලම දාන්නත් පුලුවන්. ඉතින් මේ තරම් Powerful වචනය ඔයාගේ Marketing වලට වගේම Writing වලටත් පාවිච්චිකරන්න පුලුවන්.

නිතරම Potential Customerට Satisfaction එකක්, Motivation එකක් වගේම Trust එකක් දෙන්න පුලුවන් විදිහට Messages ලියන්න. ඒ වගේම Friendly Voice එකක් Use කරන්න. ඒ Friendly Voice එකත් එක්ක ඔයා Industry එකේ Professional කෙනෙක් කියලා පෙන්වන්න පුලුවන් විදිහට Message එක ලියන්න.

නිතරම Grammatically Correct වෙන්නම ඕන නැහැ. මොකද English කතාකරනකොට ඒ තරම් Grammar ගැන හිතන්න අවශ්ය නැහැ. එහෙම කිව්ව කියලා සම්පූර්ණයෙන් Grammar අතඇරලා දාන්න බැහැ!

ඔයා එක ලියනකොට Capital Simple ගැන හිතනවද? ඔයා Sentence එකක් පටන්ගන්නකොට Capital වලින් පටන්ගන්නේ නැත්නම්, ඒක මහා Chater Feeling එකක් දෙන්නේ ගොඩක් අයට. ඒක නිසා Capital Simple ගැන හොඳට සැළකිලිමත්වෙන්න ඊළඟ Message එකේ ඉඳලා.

## ❹ Approach to Work

සමහරවිට Project එක ලොකුවෙන්න පුලුවන්, ඉතින් මේ වගේ වෙලාවක ඔයා ඒ Project එක පුන්චි පුන්චි කෑලිවලට කඩලා කොහොමද මේක කරන්නේ කියලා Plan කරන්න ඕනා. ඒ Plan එකේදී ඔයාට අවශ්යවන දේ, කොහොමද කරන්නේ, කොච්චර කාලයක් යනවද & Prize වගේ දේවල් තියෙන්න ඕනා.

Potential Customerගේ හිතේ විශ්වාසයක් ඇතිවෙනවා කියන්නේ Customer කෙනෙකුට Convert වෙන්න ගොඩක් දුරට ලං වෙනවා කියන එකයි.

සමහරවෙලාවට Customer Suggest කරන විදිහට වඩා වෙනස් විදිහකට, කාර්යක්ෂමව කරන්න පුලුවන් විදිහක් ඔයා දන්නවා ඇති. ඉතින් එහෙම වෙලාවට ඒ ගැන කියලා, ඇයි ඒ Suggestion එක Follow කරන්න ඕනා කියලත් කියන්න.

ඔයා Expert කියලා පෙන්වන්න හොන්දම දේවල් තමයි ඔය ටික.

## ❺ Last Portfolio Samples

Web Engineering, Graphic Designing වගේ වැඩකරනවා නම් ඔයාට හොඳ Portfolio එකක් හදාගන්න පුලුවන්. ඔයාගෙන් වැඩේ ගැන අහන කෙනා සමහරවිට Sample Projects ඉල්ලන්නේ නැතිවෙන්න පුලුවන්, ඒත් ඔයාගේ හොඳම Sample Projects 5ත් යවන්න අමතක කරන්න එපා.

මොකද, Message එකෙන් Convert වෙන්නේ නැත්නම් Samples දැක්කමහරි Convert වෙනවා. කෙනෙකුගේ විශ්වාසය ලබාගන්න එක ඒතරම් ලේසි නැහැ. ඒ නිසා කරන්න පුලුවන් හැමදේම කරන එක හොඳයි. නමුත් එක පුන්චි Mistake එකකින් ඒ විශ්වාසය බිමටම පාත්වෙන්න පුලුවන් කියලත් අමතක කරන්න එපා.

මම හිතනවා ඔයාල මේ පාඩමෙන් Fiverr එක ගැන හොඳ අදහසක් ගන්න ඇති කියල. දැන් මම කියපුවත් මතක තියාගෙන ඔයාගෙම Fiverr Gig එකක් හදල සාර්ථක විදියට මේ වැඩේ ඉස්සරහටම කරගෙන යන්න.